# දළදා වරුණ

මහනුවර ශ්‍රී දළදා මාලිගාව මාසිකව නිකුත් කරන
ලංකාවේ වැඩිම පිරිසක් කියවන බෞද්ධ සඟරාව

■ ශ්‍රී බුද්ධ වර්ෂ 2560 දුරුතු මස 12 වන ගුරු දින

■ 2017 ජනවාරි මස 12 වැනි බ්‍රහස්පතින්දා



■ නොමිලේ පිරිනමන දහම් පඬුරකි

■ විකිණීම සඳහා නොවේ

# බුදු හිමියන්ගේ ප්‍රථම ලංකාගමනය සිදුවූ දුරුතු පොහොය

සෑම මසකම උදාවන දෙළොස් පොහොය දිනයන්හි සිදුවූ වැදගත් මෙන්ම අසිරිමත් සිදුවීම් රාශියක් ත්‍රිපිටක සාහිත්‍යය තුළ හා අටුවා ටීකා ග්‍රන්ථයන්හි සඳහන් වෙයි. ඒ අතරින් දුරුතු පොහොය ඉතා වැදගත්ය.

වසරක් ගෙවී නව වසරක් ආරම්භ වී උදාවන පළමු වන පොහොය පින්බර දුරුත්තයි. සැඳෑ අඳුර පහ කරමින් පෙරදිග අහසේ සුපුන් සඳ නැගී එන්න අපගේ යටගියාව මෙන්ම ඓතිහාසික ආගමික පුරාවෘත්තයන් පිළිබඳව මනසට නිතැතින්ම නැගී එනු ඇත. ඒ දුරුතු පොහෝද අසිරිමත් සිදුවීමයි. එහි ඇති මාහැඟි සුන්දරත්වයයි.




ලොව්තුරා ශාන්තිනායක බුදුන් වහන්සේ සම්බුද්ධත්වයෙන් නව මසක් ඉකුත්ව ගිය පසු තම්බපණ්ණියට (ලංකා ද්වීපයට) වැඩම කොට වදාළේ මෙවන් පොහෝ දිනයකදීය. එය සිදුවූයේ උරුවෙල් දනව්වෙහි විසූ උරුවෙල් කාශ්‍යප, නදී කාශ්‍යප, ගයා කාශ්‍යප සහ තුම්බෑ ජටිලයන් ප්‍රධාන දහසක් පිරිස දමනය කොට සදහම් දෙසා යහමග යොමු කොට තථාගත ශාසනයෙහි ශ්‍රාවකයන් බවට පත් කිරීමෙන් අනතුරුවය. හෙළ දිවයිනට වැඩම කළ බුදුන් වහන්සේ මහවැලි ගඟ අසබඩ මිණිපේ නම් සරු දනව් පියසට ගුවන් ගැබින් පහළට පුන් සඳ මඬලක් සේ සවණක් ඝන බුදුරැස් මාලාවක් විහිදුවමින් වැඩ හුන් සේක.

සිය බිම් පෙදෙසෙහි පත්කඩ අතුරා රන්වන් රැස් සඳින් දිලිසෙමින් වැඩ සිටින බුදුරජාණන් වහන්සේ දුටු යක්ෂ හා නාග ගෝත්‍රිකයන් යුහුසුළුව බුදුරදුන් වෙත එළඹියේ මහා සටනකට සූදානම් වෙමිනි. එනමුදු සඳකිරණ පරයන සඩ්වර්ණ රශ්මි මාලාවෙන් පසුබැසුණු ඔවුහු දම්රදුණන්ගෙන් සුමධුර සදහස් අසා ප්‍රසාදයට පත්වූහ. මෙකල්හි සමන්ගිරි පර්වතවාසී සුමන සමන් දෙවියෝද අනගි සදහස් ශ්‍රවණය කොට සෝවාන් ඵලයෙහි පිහිටි ආර්ය ශ්‍රාවකයන් වූහ. සුමන සමන් දෙවිඳුන්ගේ ඇරයුමෙන් බුදුරජාණන් වහන්සේ හිස පිරිමැද කෙස් කළඹක් ප්‍රදානය කළහ. සමන් දෙවියෝ සැදැහැසිත් පෙරදැරිව අපමණ බුහුමන් සහිතව නිල්මිණි වන් කෙස් කළඹ සතුටින් පිළිගෙන සත් රියන් උසැති සෑයක් බන්ද එම කේශ ධාතුන් නිදන් කොට පුද පෙරහර දක්වා අසිරිමත් පින්කම් රාශියක්ද සිදු කළහ.

සිද්ධාර්ථ බෝධිසත්වයන් වහන්සේ උතුම් සම්බුද්ධත්වයට පත්වූ පළමු වර්ෂය තුළ දෙවියකු විසින් බඳින ලද මුල්ම සෑය මෙය වන අතර එය මියුගුණ මහසෑය නමින් හැඳින්වේ.

එසේම ලෝකයේම තිබෙන ඉපැරණි මහා සටනක පුරාවෘත්තයන් මතකයට නංවන තථාගතයන් වහන්සේගේ අනන්තාපරිමාණ ගුණ සමුදයන් අනුස්මරණය කරන ජාතික සංකේතයක් ලෙසින් ද මෙය සම්භාවනාවට පත්වේ.


තවද පරිනිර්වාණයට පත්වූ සම්බුදු රජාණන් ආදාහනය කරන විට දැවෙන චිතකයෙන් ලබාගත් ග්‍රීවා ධාතුව නිදන් කොට සැරියුත් මහ තෙරුන්ගේ අතවැසි සරභූ තෙරුන් විසින් හිමවතින් ගෙනෙන ලද මෙදෝවර්ණ පාෂාණයෙන් දෙළොස් රියන් උසට මියුගුණ මහසෑය බඳවන ලදහ. රහත් තෙර නමකගේ මෙහෙයවීමෙන් බඳින ලද මුල්ම දාගැබ වශයෙන්ද මෙය අතිශය ජනාදරයට පත්වේ.

පසුව දෙවන පෑතිස් රජුගේ මළණුවන් වූ උද්ධචූලාභය කුමරුන් විසින් මෙය තිස් රියන් උසැති දාගැබක් කොට කරවන ලදී. අනතුරුව හෙළ දිවයින එක්සේසත් කළ දුටුගැමුණු මහ නිරිඳු අසූ රියනක් උසට මියුගුණ සෑය බඳවන ලදහ. අනතුරුව හෙළදිව රාජ්‍ය සම්ප්‍රාප්තියට සපැමිණි වෝහාරතිස්ස, ධාතුසේන, මහා පරාක්‍රමබාහු යනාදී රජවරුන් විසින්ද මේ මහා සෑය ප්‍රතිසංස්කරණය කරන ලදහ. තවද බොහෝ කලක් වල් බිහිවී නටබුන්ව පැවැති මේ සෑ රදහු මහියංගණ චෛත්‍යය සංවර්ධන සමිතියද දිවංගත ඩී. එස්. සේනානායක අගමැතිතුමාද, ඩඩ්ලි සේනානායක මැතිතුමාද, ආර්. ප්‍රේමදාස ජනාධිපතිතුමාද කාලානුරූපීව පිළිසකර කටයුතු සිදුකරමින් අපගේ ජාතිය සංකේත උරුමයන් ආරක්ෂා කළහ. මෙනයින් සලකා බලන විට පැහැදිලි වන්නේ මියුගුණ මහාසෑය හෙළදිව පහළ වුණු පළමුවැනි සෑය ලෙසද සිංහල ජාතියේ අතීත ප්‍රෞඪත්වය ලොව හමුවේ කියාපාන රාජ පූජිත මහාර්ඝ වූ ජාතික දායාදයක් ලෙසද හැඳින්විය හැකි බවයි.

අප ශාන්තිනායක ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ උදාරතර ඓතිහාසික ප්‍රථම ලංකා ගමන සිහිපත් කරවන මහියංගණ චෛත්‍යය අදත් ලෝකවාසී ජනතාවගේ අභිවාදන පූර්වක ගෞරවයට පාත්‍රවෙමින් සජෝතිමත්ව විරාජමාන වෙති. ජාතියේ වංශ කතාවට මූලාරම්භය වැටුණු ජාතියේ ප්‍රෞඪත්වයට හා දේශයේ උදාරත්වයට ස්වර්ණමය මාර්ගය උදාවුණු සම්බුදු සිරිපා පහසින් පුණ්‍ය ක්ෂේත්‍රයක් බවට පත්වූ මේ ලක් දෙරණ සුවිශේෂත්වයට පත් කළ දිනයක් ලෙස දුරුතු පොහොය අතිශය ගෞරවාදරයට පත්වේ. එසේම සිංහල බෞද්ධයන් ආගමික හා සංස්කෘතිකමය වශයෙන් වැදගත් දිනයක්ද වේ. එසේම ශ්‍රී ලාංකීය ඉතිහාසය දෙස විමසුම් නුවණින් පිරික්සා බැලීමට සුදුසුම දිනය පින්බර දුරුතු පොහොය වේ.

**ශාස්ත්‍රපති රන්පත්වල විමලරතන හිමි**

"මේ ලෝකයේ කවරදුවත් වෛරයෝ වෛරයෙන් නොසන්සිඳෙත්. අවෛරයෙන්ම වෛරයෝ සංසිඳෙත්."



# නව වසරට අලුත් සිතුවිල්ලක්

වසර ගෙවී නව වසරක් උදාවිය. මේ ඔබ කියවන්නේ 2017 වසරේ ඔබ අතට පත්වෙන ''දළදා වරුණ'' පළමු කලාපයයි. වසර 12 කට ආසන්න කාලයක් තිස්සේ ''දළදා වරුණ'' හා නිරතුරු බැඳුණු ඔබ උදාවූ 2017 නව වසර පිළිගත යුත්තේ කෙලෙසද? නව වසරේ ඔබගේ ප්‍රාර්ථනාවන් විය යුත්තේ කුමක්ද? ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ මහාචාර්ය නෙළුවේ සුමනවංශ මාහිමිපාණන් වහන්සේගෙන් අපි ඒ ගැන විමසා බැලුවෙමු.

**❐ වසරක් ගෙවී නව වසරක් උදාවුණා. හාමුදුරුවනේ, නව වසරක් කියන්නේ කුමක්ද?**

නව වසරක් යන්නෙහි අදහස කල්පනා කරලා බැලුවොත් මිනිස් සමාජයට තමන්ගේ කාර්යයන් නැවත වරක් අලුත් කරගන්නට, අලුත් හැඟීම්වලින් ආරම්භ කරන්නට පනවාගත් කාල පරිච්ඡේදයක් ලෙස දැක්විය හැකියි. සිංහල ක්‍රමය සහ ලෝක සම්මත ක්‍රමය නව වසර වෙනවා. සිංහල ක්‍රමයට අවුරුද්ද ජ්‍යොතිෂය එක්ක සම්බන්ධ වෙලා තියෙනවා. ලෝකයේ බහුතරයක් දෙනා දෙසැම්බර් 31 වසරක් අවසන්ව ජනවාරි පළමු වනදා තවත් වසරක් ආරම්භ වන බව සලකනවා. මේ 2017 අලුත් වසරක් විදියට ආරම්භ වුණු අවස්ථාවයි.

**❐ මෙය ධර්මානුකූලව සලකනු ලැබුවහොත්?**


ධර්මය පැත්තෙන් ගෙන බැලුවොත් අවුරුද්දක් කියන්නේ මිනිසුන්ට අනිත්‍ය ස්වභාවය ගැන කල්පනා කර බලා ලෝකයේ යථා ස්වභාවය තේරුම් ගන්න හොඳ අවස්ථාවක්. කාලය ගත වෙනවා. අලුත් කාලය උදාවෙනවා. කටයුතු ඉක්මනින් කරන්න කියලා බුද්ධිමත්ව කල්පනා කළොත් ඉතාම වටිනවා.

**❐ වසරක් අලුත් වුණාට මිනිසුන් නම් බොහෝවිට අලුත් වන බවක් පෙනෙන්නට නැති වගෙයි නේද අපේ හාමුදුරුවනේ?**

මිනිසුන්ට ඔවුන්ගේ ක්‍රියාවන්, ජීවිතය, අඩුපාඩු, දුර්වලතා, ගැටලු මොනවාද කියා සිතා බලන්නට හොඳම කාලයයි නව වසරක උදාව. ඒවා තේරුම් ගෙන අලුතින් පටන් ගන්න කාලය මෙයයි. සමහර දේවල් සමාජයට අතහිත පිණිස වන්න පුළුවන්. එහෙම වෙනවා නම් ඒවයින් ඉවත් විය යුතුයි. එහෙම වුණොත් තමයි නව වසර අර්ථවත් වන්නේ. පවත්වාගෙන එන දේවල් පවත්වාගෙන එන්න, නරක දේවල් හදාගන්න, පරණ වසරේ අඩුපාඩු නව වසරේ අත හරින්න, පෙරට ගමන් කරන්න හොඳම අවස්ථාව මෙයයි. මනුෂ්‍යයන්ට අවුරුද්ද වැදගත් කාරණයක්.

**❐ එදා සහ අද නව වසරක උදාව කෙබඳුද අපේ හාමුදුරුවනේ?**

මීට වසර පනහකට, හැටකට තරම් එහා කාලයේ අද ක්‍රමයට නෙමෙයි අවුරුද්ද සමරන්නේ. අද හැම දෙයක්ම විසිතුරු බවට පත්කර ගෙනනේ. උත්සව කරගෙන. වාණිජකරණය කරගෙන. අතීත සමාජයේ එහෙම බැලුවේ නැහැ. බුද්ධිමත්ව ආරම්භ කළා. එදා මිනිසුන්ට අදට සාපේක්ෂව තිබුණ ප්‍රශ්න අඩුයි. ආශාවන් අඩුයි. අද ආශාවන්, උපකරණ වැනි දේවල් වැඩිවීම නිසාම ඇතැමුන්ට අවුරුද්දට මුහුණ දෙන්නත් බැරි වන අවස්ථාවන් අපට අසන්නට,



දකින්නට ලැබෙනවා. නව වසරක් උදාවීම කෙනෙක් සිතට බරක් ලෙස සිතනවා. තවත් කෙනෙක් සතුටක් ලබනවා. සතුටක් ලබනවා කියන්නේ එහි දුකකුත් තියෙන්න පුළුවන්. සතුට සතුටෙන්ම අවසන් වෙයි කියා සිතනවා. නැටුම නැටුමෙන් අවසන් වෙයි කියා සිතනවා. එහෙම දෘෂ්ටියක් තමයි වර්තමානයේ බොහෝ දෙනකුට තියෙන්නේ. එහෙම කෙනෙකුට කනගාටුවක් ඇති වන්න පුළුවන්. අවුරුද්ධ ගැන මධ්‍යස්ථව කල්පනා කිරීමයි වැදගත්.

**❐ නව වසර ගැන මධ්‍යස්ථව කල්පනා කිරීම වඩා වැදගත් බවයි ඔබවහන්සේ සඳහන් කළේ. ඒ පිළිබඳ තවදුරටත් විග්‍රහ කළොත්?**


ඔව්, ඕනෑම දෙයක් පිළිබඳව සර්ව අසුබවාදීව හෝ සර්ව සුබවාදීව බැලිය යුතු වන්නේ නැහැ. මධ්‍යස්ථාව, බුද්ධිමත්වයි බැලිය යුතු වන්නේ. ඕනාවට වඩා සතුටු වෙනවා කියන්නේ, ඕනාවට වඩා සමරනවා කියන්නේ එය ව්‍යසනයක්ද කියලා ජේනවා. අද අපරදිග සිරිත් විරිත් තමයි බොහෝවිට අනුගමනය කරන්නේ. පෙරදිග කියන්නේ හොඳ හර පද්ධතියක් හා බද්ධ වූ දේවල්. එදා එය සැමරුවේ ආගමික පරිසරයත් එක්කයි. දැන් සියල්ලක්ම වාණිජකරණය වෙලා. පොඩි ළමුන්ට, අනාගත පරපුරට ලබාදෙන්නේ හොඳ පණිවුඩයක් නෙමෙයි. මෙහෙම ගියොත් වත්මන් පරපුර හිතයි මත්ද්‍රව්‍ය බීලා, උත්සව තියන එක තමයි අවුරුද්ද කියලා.

**❐ සමාජය විවිධයි. පුද්ගලයන් විවිධයි. එවන් සමාජයකට උදාවුණ මේ නව වසරේ ලබාදෙන පණිවුඩය කුමක්ද?**

සැමදෙනාම අලුත් සිතුවිලි ඇති කර ගත යුතුයි. අලුත් ශක්තියකින්, අලුත් ජවයකින්, ප්‍රාණවත් බවකින් හොඳ අධිෂ්ඨාන ඇති කර ගත යුතුයි. මේ උදාවූ නව වසරේ තමන් මේ ඉලක්කය වෙත ගමන් කරනවා, අභියෝග ජය ගන්නවා කියන අරමුණක් පිහිටුවා ගත යුතුයි. ඒ පිහිටුවා ගත් අරමුණ සාක්ෂාත් කරගැනීමට කටයුතු කළ යුතුයි. අධ්‍යාපනය ලබන අය වේවා, රැකීරක්ෂා කරන අය වේවා, ගොවිතැන් කරන අය වේවා, ගිහි වේවා, පැවිදි වේවා, කවුරුන් හෝ වේවා මේ නව වසරේ ධනාත්මක චින්තනයක් පිහිටුවා ගැනීමට හොඳම අවස්ථාවයි.

**ජනක හෙට්ටිආරච්චි**

''යමකු බැරිවීමකින් පවක් කළත් නැවත නැවත එය නොකළ යුතුය. පව් කිරීම නිසැකවම දුකට හේතු වේ.''



# පිං පොත ලියමුද ?

පුණ්‍යපොත්ථක හෙවත් පින් පොතෙහි ඉතිහාසය සොයා බලන විට පෙනී යන්නේ එය පුරාණ අනුරාධපුර අවදියේ පටන් මෙරට සමාජය තුළ පැවැති සංස්කෘතිකාංගයක් බවය. තම තමන් විසින් කරන ලද පින්කම් නැවත නැවත සිහිකිරීම, අන් අය සමග කතාබස් කිරීම, ලේඛන ගත කොට තැබීම කරන ලද පින තවදුරටත් වැඩි දියුණු වීමට හේතුවක් වන බව බුද්ධ දේශනාවේද සඳහන් කර ඇත.

"පින් කළ තැනැත්තා මෙලොවදී සතුටු වෙයි. පරලොවදීද සතුටු වෙයි. මා විසින් මේ පින කරන ලද්දේ යැයි සිතා නැවත නැවත සතුටු වෙයි. පරලොවදී පිනෙහි සැප විපාක විඳිමින් බෙහෙවින් සතුටු වෙයි."

(ධම්මපදය, 10 ගා.)

මේ අනුව පැරැන්නන් විසින් තමන් කළ පින්කම් නැවත නැවත සිහිපත් කරමින් සතුටු වීමට, ඒවා ලේඛන ගත කොට තබා ගැනීමට යොමුවූ බව පෙනී යයි. මෙහි මූලික අරමුණව ඇත්තේ කරන ලද පින්කම් මෙනෙහි කර නැවත නැවත සතුටු වීමත්, ජීවිතයේ අවසන් සමයේදී, මරණ මංචකයේදී එලෙස ලියන ලද පින්කම් කියවාගෙන පහන් සිතින් මිය යාමේ අපේක්ෂාවත්ය. එමෙන්ම තමන් කරන ලද පින්කම් අනාගත පරපුරට දකින්නට සලස්වා ඔවුනුත් මේ පින්කම්හි යෙදිය යුතුය යන පණිවුඩයද මෙමගින් සපයා තිබේ.

මේ අරමුණු පෙරදැරි කරගත් පුණ්‍යපොත්ථක ලිවීමේ සම්ප්‍රදාය පිළිබඳ මුල් වරට හමුවන්නේ දුටුගැමුණු රාජ්‍ය සමයේදීය. ඊට පෙර ලියන ලද පින් පොත් පිළිබඳ වාර්තා නොවූවද ක්‍රි.පූ. 3 වන සියවසේ පටන් භික්ෂූන් වහන්සේලාට පූජා කරන ලද ලෙන්හි කටාරමට යටින් කොටා ඇති කෙටි බ්‍රාහ්මී ලේඛන තුළින් පෙනී යන්නේද මෙරට සමාජය තුළ කරන ලද පින් සඳහන් කර තැබීමේ වුවමනාව මුල් කාලයේ පටන් පැවැති බවය. ඇතැම් බ්‍රාහ්මී ලේඛන ලෙන් පියස්ස මුදුනෙහි කොටා ඇත්තේ මහත් ආයාසයක් දැරීමෙනි. උදාහරණයක් ලෙස,

"පව් කරන්නා මෙලොවත් ශෝක කරයි. පරලොවත් ශෝක කරයි. දෙලොවම ශෝක කරයි."

"පරුමක පලිකඳ පුත උපසක හරුමස ලෙනෙ චතුදිසසගස"

පරුමක පුලිකදගේ පුත්‍ර හරුමස උපාසකගේ ලෙන සිව්දිගින් පැමිණි සංඝයාටය.

(අනුරාධපුර, වෙස්සගිරිය ලෙන් ලිපි)

මෙලෙස කෙටියෙන් දක්වුවද, තදීය පූජාව කළාවූ පුද්ගලයන් ස්වකීය නම්ගොත් ආදිය දක්වමින් ලෙන් ආවාස භික්ෂූන්ට පූජා කොට තිබේ. දඹදිව ධර්මාශෝක අධිරාජයාද තමා විසින් කරන ලද පින් ශිල් ලේඛනගත කොට තබන ලද බව අශෝක ධම්ම ලිපි තුළින් පෙනේ.

"මිනිසුන්ට පමණක් නොව 'තිරිසන් සතුන්ට පවා සෙවණ ලබාගනු පිණිස මහා මාර්ග යෙහි දෙපස නුග ගස් රෝපණය කරවන ලදී... අඹ උයන් කරවන ලදී. විශ්‍රාම ශාලා කරවන ලදී... මිනිසුන්ගේද, සතුන්ගෙ 'ද ප්‍රයෝජනය සඳහා තැනින් තැන මවිසින් ජලස්ථාන කරවන ලදී." (අසෝක ධම්ම ලිපි, අභය ආර්යසිංහ) ආදී වාර්තා බොහෝ ලේඛනවලින් හමුවේ.

## දුටුගැමුණු මහරජතුමාගේ පින් පොත


මහාවංශයේ තිස් දෙවන පරිච්ඡේදයේ ආරම්භයේ මේ පිළිබඳව සඳහන් වේ. එහි එන පරිදි මරණාසන්න අවස්ථාවේදී රජතුමා රත්නමාලී මහා සෑයත්, ලෝවාමහා ප්‍රාසාදයත් අතර රන්සිවිගෙයක හිඳිමින් ඒ ඒ දිශාවලින් වැඩි සයානුකෙළක් පමණ මහා සංඝයාගේ ගණසජ්ඣායනාවට සවන් දෙමින් සිටි බව කියැවේ. ඒ සඳහා වැඩි මහා සංඝයා අතර ථෙරපුත්තාභය තෙරුන් වහන්සේ නොදක, අටවිසි මහා යුද්ධයේදී යුද්ධ කෙරෙමින් පරාජය නොවූ මාගේ යෝධ වූ ථේරපුත්තාභය නම් ස්ථවිර දූන් මාර යුද්ධ පැමිණි කළ මාකරා නොඑළඹෙන සේක පරාජය දක උන්වහන්සේ නොවඩින සේකැයි මෙවැනි කල්පනාවක් රජතුමා ඇතිකර ගනී.

රජතුමාගේ ඒ සිතුවිල්ල දත් ථේරපුත්තාභය තෙරුන් වහන්සේ පන්සියයක් පමණ වූ මහ රහතුන් පිරිවරා වැඩම කොට රජතුමාට අනිත්‍ය ප්‍රතිසංයුක්ත ධර්ම දේශනයක් පවත්වමින්,

"තොප විසින් එක්සේසත් කොට රාජ්‍යකරණයත් සසුන් බැබළවීම පිණිසය. එබැවින් මහා පින් ඇත්තාණනි, අද දවස තෙක් තොප විසින් කළ පින් සියල්ල මෙනෙහි කර මේ උපායෙන් තොපට කෙකෙණෙහි සුව වන්නේ" යැයි වදළහ.

තෙරුන් වහන්සේගේ බස් අසා රජතුමා අතිශයෙන් ප්‍රසන්න සිතැතිව ඔබ මාර යුද්ධයෙහිත්, මට අත්‍යන්තයෙන් උපකාර සේකැයි කීයේය. පහන් සිත් ඇත්තේ එකෙණෙහි පින් පොත ගෙන්වා ඒ කියන්නම ලියන්නා මෙහෙයීය.

(මහාවංශය 32 පරි:, 26 ගා.)





මහාවංශයේ එන ඉහත විස්තරයෙන් පෙනී යන්නේ දුටුගැමුණු රජතුමා මරණාසන්න අවස්ථාවට පැමිණ සිටින අවස්ථාවේදී ථේරපුත්තාභය තෙරුන් වහන්සේ රජු ඉදිරියේ පින් පොත කියවමින් කරන ලද පින් සිහි ගන්වමින් අනුශාසනා කළ බවය. දුටුගැමුණු රජතුමා පමණක් නොව සෙසු රජුන්ද මේ සිරිත අනුගමනය කරන්නට ඇත. රජුන් විසින් කරන ලද පින්කම් වාර්තා කර තැබීමේ සම්ප්‍රදයක් මෙරට වංශකතාකරුවන් ඉතා වුවමනාවෙන් සිදුකළා වූ කටයුත්තක් බව පෙනේ. මහාවංශය සමස්තයක් ලෙස ගෙන බලන කල්හි පෙනී යන්නේ එහි හරි අඩකට වඩා මිඩංගු කර ඇත්තේ ඒ ඒ රජවරු සිදුකළා වූ පින්කම් වර්ණනයට බවය. මහාවංශය රචනා කිරීමේ අරමුණ වී ඇත්තේද එය අසා, කියවා පහන් සංවේග ඉපදවීම බව ග්‍රන්ථාරම්භයේදීම සඳහන් කොට තිබේ.

මහනුවර යුගය දක්වාමත් පින් පොත් ලීමේ සම්ප්‍රදය හොඳින් පැවැති බව මොරතොට දිනපොත, හරංකහවේ බුද්ධරක්ඛිත ස්වාමීන්ගේ පින් පොත, සරම්මුදලිතුමාගේ පින් පොත යනාදියෙන් පැහැදිලි වේ. පින් පොත්වල අමතරව පුණ්‍ය පත්‍ර, පුණ්‍ය ලේඛන, පුණ්‍යානුමෝදනා පත්‍ර වශයෙන්ද කරන ලද පින් ලියා තබාද, අන් අයට අනුමෝදන් වීම දන්වා යැවූ අවස්ථාද පැරණි ලේඛන ආශ්‍රයෙන් හමුවේ. ඔබත් පින් පොතක් ලිවීමෙන් එය කියවා බලන වාරයක් පාසා පින් සිදුකර ගැනීමට උත්සාහවත් වන්න.

**පූජ්‍ය හෙම්මාතගම පියදස්සි හිමි**

"අනුන්ගේ රළු පරළු කතාත් අනුන් කළ නොකළ දේත් නොසෙවිය යුතුය. තමාගේම කළ නොකළ දේ සෙවිය යුතුය."



# බුදුරජාණන් වහන්සේ තුළ පැවති උත්තරීතර මානුෂිකත්වය

තිලෝගුරු බුදුරජාණන් වහන්සේ කෙරෙහි පැවතියා වූ ශ්‍රේෂ්ඨ උත්තරීතර මානුෂිකත්වය සම්බන්ධයෙන් තොරතුරු සඳහන් වන මූලාශ්‍ර අතර මහාපරිනිර්වාණ සූත්‍රය ද වැදගත් මූලාශ්‍රයකි. මහායානිකයන්ගේ මතය අනුව බුදුන් වහන්සේ ජාති, ජරා, ව්‍යාධි, මරණයට ලක් නොවන බව සඳහන් කර ඇතත් පරිනිර්වාණ සූත්‍රයේ දී ආනන්ද තෙරුන් වහන්සේ අමතන බුදුන් වහන්සේ, තමන් වහන්සේ ද ජාති, ජරා, ව්‍යාධි, මරණයට ලක්වන බව සඳහන් කරයි. බුදුන් වහන්සේ තම ශරීරය ජරාජීරණ තත්ත්වයට පත් අසූ වියෙහි මහල්ලෙකු බවත්, ඉතා අමාරුවෙන් දිරාගිය ගැලක් මහ මග මාට්ටු කරගෙන යන්නාක් මෙන් තම ශරීරය ද අමාරුවෙන් පවත්වාගෙන යන බව සඳහන් කර තිබීමෙන් උන්වහන්සේ තුළ පැවති සාමාන්‍ය මනුෂ්‍ය ස්වභාවය පිළිඹිබු වූ බවට සාධකයකි. අවසාන කාලය වන විට බුදුන් වහන්සේ කුදුව ගිය ශරීරයකින් සාමාන්‍ය මිනිසාට දැනෙන කායික වේදනා උන්වහන්සේ තුළ ද පොදු ලක්ෂණ බව පෙනේ. මජ්ඣිම නිකායේ 'ගුලිස්සානි' සූත්‍රයේ සඳහන් වන පරිදි වරෙක ආනන්ද තෙරුන් වහන්සේ සමඟ පිරිසක් මැද ධර්මය දේශනා කරන අතර තුර පිටේ වේදනාවක් පහල වී ධර්මය දේශනා කිරීම ආනන්ද තෙරුන්ට භාර කොට බුදුන් වහන්සේ පසෙකට වී විවේක සුවයෙන් වැඩ විසූ සේක. බුදුන් වහන්සේ ද සාපිපාසාදියෙන් පෙළෙන ක්ලාන්ත ගතියෙන් පීඩාවට පත්වූ උතුමෙකු බව පරිනිබ්බාන සූත්‍රයෙන් අනාවරණය වේ. පිරිනිවන් පෑම සඳහා කුසිනාරාවට ගමන් කරන බුදු රජාණන් වහන්සේ අතරමග දී ක්ලාන්ත ගතිය වැළදී මහමග අයිනේ

''මෝඩයා මට දරුවෝ ඇත. මට ධනය ඇත කියා සිතමින් උද්දාම වෙයි. තමාට තමනුත් නැති කල කුමන දරුවෝද? කුමන ධනයද?''

අසුන් ගෙන ආනන්ද හිමියන් ලවා පැන් ගෙන්වා වැළඳූ බවත් මේ සූත්‍රයේ වැඩි දුරටත් සඳහන් වේ.


එසේම බුදුන් වහන්සේ සාමාන්‍ය මිනිසුන් මෙන් ස්වභාව සෞන්දර්යයේ පැවති සුන්දරත්වය ගැන කථා කළ ආකාරය පරිනිබ්බාන සූත්‍රය ප්‍රධාන කොට ඇති මූලාශ්‍ර කිහිපයකින්ම අනාවරණය වෙයි. එනම් විශාලා, සාරානන්ද, ඡාපාල සහ බහුපුත්තක වැනි ස්ථානවල පැවති ස්වභාව සෞන්දර්ය වර්ණනා කර ඇති අයුරු දක්නා ලැබේ. මේ අනුව බුදුන් වහන්සේ සාමාන්‍ය මිනිසුන්ට ඇති හැඟීම් දැනීම් දැනෙන මනුෂ්‍ය ශාස්තෲවරයාණන් වහන්සේ කෙනෙක් බව මනාව පසක් වේ. බුදුන් වහන්සේ විශාලාව පසු කරගෙන යන ගමනේ දී නගර සීමාවේ නැවතී ආපසු හැරී මොහොතක් බලා සිට ආනන්ද මේ තථාගතයන් වහන්සේ විශාලාව දෙස බලන අවසාන අවස්ථාව යැයි අනුවේදනීය ලෙස සඳහන් කර ඇත. බුදුන් වහන්සේ විශාලාවට වෙනත් තැන්වලට වඩා ඇලුම් කිරීමට හේතුව නම් එහි ස්වභාව සෞන්දර්යයේ පැවති අභිරමණීයත්වයයි. එසේම බුදුන් වහන්සේ ඇතුළු භික්ෂූන්ට ඉතා බැතිමත්ව සලකනු ලබන ලිච්ඡවී වංශිකයන් වැනි හිතවත් දායක පිරිසක් වාසය කළ නිසාත් විශාලා වැසියන් නොවැඩි රහතන් වහන්සේලාට වැඩම කරත්වායි චේතනාවෙන් ද වැඩම කළ රහතන් වහන්සේලාට පහසුවෙන් ජීවත් විය හැකි පරිද්දෙන් සැලකූ පිරිසක් වශයෙන් සැදැහැවත්ව වාසය කළ බවත් සඳහන් වේ. ඒ අනුව මිනිස් වාසයට ඉතාමත් සුදුසු පියකරු ස්ථානයක් වීමත්, තම සිත්ගත් අනාගාමික පිරිසක් සිටීමත් නිසා එබඳු සුදුසු යහපත් ප්‍රදේශයක් අතහැර දමා යන අවස්ථාවක ඇතිවන සාමාන්‍ය මිනිස් ගතිය ද එහිදී ඉස්මතු වේ. මේ අනුසාරයෙන් බුදුරජාණන් වහන්සේ උත්තර මානුෂිය හැඟීම් වලින් හෙබි ශ්‍රේෂ්ඨ මානුෂිකත්වයකින් යුතුව කටයුතු කළ බව පැහැදිලිය.

බුදුරජාණන් වහන්සේ පරිනිර්වාන මංචකයේ අවසාන මොහොතේ වැඩසිටිමින් සිටි අවස්ථාවේ කඳුලු සලමින් දුක්ඛිතව සිටි භික්ෂූන් අමතා, දැන් මගේ වයස මුහුකුරා ගියේ වෙයි. තවත් ජීවත් වීමට ඇත්තේ සුළු වේලාවක් පමණි. මාගේ යහපත පිණිස ඇවැසි කටයුතු නිමා කර ඇත. සියළු සංස්කාරයෝ අනිත්‍ය බැවින් නොහඬා නොවැලපී ස්වකීය ආධ්‍යාත්මික දියුණුවට කටයුතු කරගන්නැයි කළ ඉල්ලීම මරණ මංචකයේ වැදහොවනා පියෙකු ශෝකයෙන් පසුවන තම දූ දරුවන් අමතා කරන අවසන් ඉල්ලීමක් බඳුය. බුදුන් වහන්සේ අවසාන මොහොතේ පවා උතුම් පරාර්ථචරියාවේ නියලුන මහා කාරුණික උත්තම මනුෂ්‍ය රත්නයක් බව පිරිනිවන් මංචකයේ දී භික්ෂූන් අමතා, මහණෙනි, රත්නත්‍රය විෂයෙහි කිසියම් සැකයක් විමතියක් ඇත්නම් දැන්මම එය අසා දැනගන්න යනුවෙන් කළ ප්‍රකාශයෙන් පැහැදිලි වේ.

වරෙක ද්‍රෝණ නම් බ්‍රාහ්මණයා තමන් කවුදැයි ඇසූ අවස්ථාවේ තමන් වහන්සේ, යක්ෂයෙකු ගාන්ධර්වයෙකු දෙවියෙකු වැනි අත්භූත පුද්ගලයෙකු නොවන බවත් සන්තානගත පාරිශුද්ධිය ලැබූ අසිරිමත් පුද්ගලයෙකු බවත් යනුවෙන් පැවසූ ප්‍රකාශයෙන් උතුම් මිනිසත් බව සනාථ වේ. චාපාල චෛත්‍යස්ථානයේ දී බුදුන් වහන්සේ වෙත පැමිණි මාරයා තමන් වහන්සේට ඉක්මණින් පිරිනිවන් පාන ලෙස ආරාධනා කළ අවස්ථාවේ දී භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිවුවනක් පිරිස ව්‍යක්ත විනීත විශාරද භාවයට පත්වන තුරු ඔවුන්ට පරවාද ඛණ්ඩනය කිරීමේ හැකියාව ලැබෙන තුරු තම ධර්මය



''යමක් කොට පසුතැවෙන්නට වේද යමක විපාකය කඳුළු පිරි මුහුණෙන් යුක්තව හඬමින් විඳින්නට සිදුවේ.''




අප්‍රමාණ ජනතාවගේ සසර එතෙර වීමට ඉවහල් වන තුරු පිරිනිවන් නොපාන බව දන්වා වදාළ සේක.

පරිනිර්වාණ සූත්‍ර දේශනාවේ හා අවශේෂ අවස්ථාවන්හි එන දේශනා තුළින් මිනිස් සිතක රෝගය, ජරාව, මරණය ආදියේ ඇතිවන ගැටුම් ගැන සලකන විට බුදුරජාණන් වහන්සේ උත්තරීතර මනුෂ්‍ය රත්නයක්ව, මරණය ජයගැනීම හෙවත් පරිනිර්වාණ ධාතුවට නිසි කළ පැමිණ වදාළ සේක. වරක් බුදුරජාණන් වහන්සේ වක්කලී හිමියන් අමතා, මේ කුණු ශරීරය දෙස, රූපකාය දෙස බලා සිටීමෙන් පලක් නැතැයි ප්‍රකාශ කිරීමෙන් ද උන්වහන්සේ මිනිසත් බවින් යුක්තව වැඩසිටි බව පසක් වෙයි. භික්ෂූන්ට තුන් සිවුර අනුමත කළේත්, එක් වේලක් වළඳා ජීවත් වීමේ ආනිශංස ප්‍රකාශ කළේත් සාමාන්‍ය මනුෂ්‍ය ජීවිතයක අත්දැකීම් තුළිනි. සුනීත, සෝපාක, පූතිගත්තතිස්ස වැනි රෝගීන්ට පවා උපකාර කළ ආකාරය තුළින් ද උන්වහන්සේගේ උතුම් මානුෂිකත්වය පිලිබිඹු වේ.

බුදුන් වහන්සේ වරින් වර සන්ධක, මාගන්ධියා, පාඨිකපුත්‍ර වැනි තවුසන්ගේ ආරාම වලට ගොස් සුහද මිත්‍ර ලීලාවෙන් ඔවුන් සමඟ කතාබහ කිරීම උන්වහන්සේගේ පැවතියා වූ උන්වහන්සේගේ පැවතියා වූ ආගමික සහනශීලීත්වය වටහා ගත හැකි වේ. ආනන්ද තෙරුන් වහන්සේගේ ධර්ම දේශනාවකට සවන්දුන් ආකාරය පිළිබඳ දැක්වෙන කථා පුවතින්, උන්වහන්සේ තුළ පැවති නිරහංකාර චාම් ගති ගුණ ඉස්මතු වේ. බ්‍රාහ්මණයින් බුදුන් වහන්සේ දාර්ශනික වූ ප්‍රසාද පුද්ගලයෙකු බවත් මවුපිය දෙපසින්ම පිරිසිදුව ශාක්‍ය කුලයේ ජනිත වී තරුණ වියේ දී ගිහි ජීවිතය අතහැර පැවිදි වූ රාජවංශිකයෙකු බවත්. ප්‍රියශීලී පුද්ගලයෙකු වශයෙන්, සත්‍ය වචනයම කථා කළ, චතුස්සත්‍ය අවබෝධ කළ බුදුන් වහන්සේ දෙවියෙකු හෝ, බ්‍රාහ්මණයෙකු හෝ, අද්භූත පුද්ගලයෙකු හෝ නොවේ. එහෙත් ශ්‍රේෂ්ඨ මනුෂ්‍ය රත්නයක් වශයෙන් දේවාතිදේව වූහ. බ්‍රහ්මාතිබ්‍රහ්ම වූහ. මහත් දුක්ඛ පීඩාවන්ගෙන් දුක්ඛිත වූ ලෝක සත්වයා සසර කතරින් එතෙර කොට අසූ වියේ දී සාමාන්‍ය මනුෂ්‍යයෙකු සේම ආශ්වාස ප්‍රාශ්වාස දෙක නිරුද්ධ වීමෙන් පිරිනිවන් පා වදාළ සේක. උන්වහන්සේ වනාහි ලෝකසත්වයා කෙරෙහි මහත් අනුකම්පාවෙන් මහත් දුෂ්කරතා විඳ නිර්වාණ මාර්ගය සාක්ෂාත් කොට ලෝසතුන් සසර දුකින් මුදවා වදාළ අතිශ්‍රේෂ්ඨ මනුෂ්‍ය රත්නයක්මය.

ශාස්ත්‍රවේදී පූජ්‍ය තිබ්බටුවාවේ සිද්ධත්ථ ස්ථවිර

"දෙවූ වහාම කිරි නොම්දෙන්නාක් මෙන් කෙනෙකු විසින් කරන ලද පව වහා නොමෝරයි. එය අළු යට වූ ගිනි පුපුරක් මෙන් ඔහු දවමින් පසුපස ලුහු බඳී."




මිනිසා සමාජශීලී සත්වයෙකි. මිනිසාගේ ජීවිතය සමාජය සමග බද්ධව පවතී. විවිධාකාර සමාජ සම්බන්ධතා සහිතව දිවි ගෙවන මිනිසා හට ඇසුරට ලැබෙන මිතුරන් අතර මිතුරු වෙසින් ළංවෙන මිත්‍ර ප්‍රතිරූපකයන් හඳුනා ගැනීමෙන් විපතේ වැටීමට ඇති ඉඩ අවකාශය වළකා ගත හැකිය. බුද්ධ දේශනාවට අනුව මිත්‍ර ප්‍රතිරූපකයෝ සිව් දෙනෙකි. ඔවුන් මෙසේ දැක්විය හැක.

1. අඤ්ඤදත්ථුහර, 2. වචීපරම, 3. අනුප්පියභාණී, 4. අපායසහාය යනුවෙනි. මෙම මිතුරන් සිව් දෙනාගේ ස්වභාවය බුදු දහමේදී මෙසේ විවරණය කොට ඇත.

අඤ්ඤදත්ථුහර යනු මිතුරු වේෂයෙන් පැමිණ මිතුරාගෙන් යමක් ගෙන යාමටම පැමිණෙන පාප මිත්‍රයාය. මිතුරාගෙන් යමක් ලබා ගැනීමට මෙම මිත්‍ර පතිරූපකයා හිතෛෂී ලීලාවෙන් මිතුරන්ට ළංවෙයි. එම මිත්‍ර පතිරූපකයා සෑම විටම උත්සාහ කරන්නේ තමාගෙන් මිතුරාට නොව මිතුරාගෙන් තමාට යමක් ලබා ගැනීමටය. මෙවැනි ස්වභාවයෙන් යුතු මිතුරන් ආශ්‍රයෙන් දුරුවන ලෙස බුදුරජාණන් වහන්සේ දේශනා කළ සේක. වචීපරම යනු මිත්‍රයා හට වචනයෙන් පමණක් උදව් කිරීමට ඉදිරිපත් වන, ක්‍රියාවෙන් උදව් උපකාර නොකරන, යහළුවාව වචනයෙන් රැවැටීමට ක්‍රියා කරන පාප මිත්‍රයාය. මොහුගේ ස්වභාවය වන්නේ සෑම අවස්ථාවේදීම මිතුරාට වචනයෙන් පමණක් සංග්‍රහ කිරීමයි. ඉතා හිතෛෂී බවක් පෙන්නුවද ඔහුගේ ක්‍රියා වචනයට පමණක් සීමා වෙයි. අනුප්පියභාණී නම් මිත්‍ර ප්‍රතිරූපකයාගේ ස්වභාවය මෙසේය. මෙම පාප මිත්‍රයා යහළුවාගේ හොඳ නරක දෙකම අනුමත කරමින් යහළුවාගෙන් තමාට ලැබෙන වාසි පිළිබඳ සිහි කරමින් ඔහු සමග සිටිනා පාප මිත්‍රයාය. තම යහළුවා කරන යහපත් වැඩක් වුවද, අයහපත් වැඩක් වුවද මොහු අනුමත කරයි.


අපායසහාය අපායට යන ක්‍රියාදාමයන්ට මිතුරාව සමාදන් කිරීම මිතුරාව යොමු කිරීමට කටයුතු කරන පාප මිතුරාය. මෙම මිත්‍ර ප්‍රතිරූපකයන් හඳුනාගෙන ඔබේ මිතුරාත්, මිත්‍ර ප්‍රතිරූපකයෙක්දැයි දැන හඳුනා ගැනීම අප සැමට ඉතා වැදගත්ය.


# මිතුරා සහ සතුරා හඳුනා ගනිමු



පූජ්‍ය හල්මිල්ලකුලමේ සුජාතඥාන හිමි

"තමාට පිහිට තමාමය. වෙන කවරෙක් තමාට පිහිට වේද? තමා මනාව දැමුණු කල දුර්ලභ වූ පිහිටක් ලබන්නේය."





දේශකයාණෝ - මහනුවර හයගිරි විජයසුන්දරාරාම විහාරද්වයාධිපති, ඓතිහාසික බදුලු මුතියංගණ රාජමහා විහාරාධිපති, ශ්‍රී දළදා මාළිගාවේ තේවාවහාර, අතිගෞරවාර්හ
වරකාගොඩ ධම්මසිද්ධි ශ්‍රී පඤ්ඤානන්ද ඤාණරතනාභිධාන
මහාවිහාරවංශික ස්‍යාමෝපාලි මහානිකායේ අස්ගිරි මහාවිහාර පාර්ශවයේ මහානායක මාහිමිපාණන් වහන්සේ

# ප්‍රඥාව වැඩීමෙන් නිවන් මග පසක් වේ

"කතමා ච භික්ඛවෙ අධිපඤ්ඤාසික්ඛා: ඉධ භික්ඛවෙ භික්ඛු ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති - පෙ - අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති. අයං වුච්චති භික්ඛවෙ අධිපඤ්ඤාසික්ඛා."

පින්වත්නි,

අංගුත්තර නිකායේ තික නිපාතයට අනුව "මේ දුකය, මේ දුක්ඛනිරෝධගාමිනී ප්‍රතිපත්තියය යන යථාභූතය දැනීම අධිප්‍රඥා ශික්ෂාවයි."

ආස්‍රවක්ෂය කිරීමෙන් අනාස්‍රව වූ චෙතෝවිමුක්ති හා ප්‍රඥාවිමුක්ති ඉහාත්මයෙහිම තෙමේම විශිෂ්ට ඥානයෙන් ප්‍රත්‍යක්ෂ කොට ඊට එළඹ විසීම අධිප්‍රඥා ශික්ෂාව හෙවත් අර්හත් මාර්ගය යැයි කියනු ලැබේ. විදර්ශනාවෙන් ප්‍රඥාවේ අනුක්‍රමික සංවර්ධනයක් ඇති වේ. අධිශීලයෙහි හා අධිචිත්තයෙහි පිහිටා අධිප්‍රඥාව

"සියල්ලෝ දඬුවමට තැති ගනිත්. සියල්ලෝ මරණයට බිය වෙත්. ඒ නිසා තමා උපමා කොට සිතා අනුන් නොනැසිය යුතුය. නොනැස්විය යුතුය."

පිහිටුවා ගත හැකිය. විසුද්ධි මාර්ගයට අනුව කුසල් සිතෙහි යෙදුනු විදර්ශනා ඥානය ප්‍රඥාව යැයි අභිප්‍රේතය. අරමුණු හැඳිනීමෙහි ද, අනිත්‍යාදී ලක්ෂණ දැනීමෙහි ද, මාර්ග පහළ කිරීමෙහි ද ප්‍රඥාව සමර්ථ වේ. අරමුණු ආකාර දැනීමට ද, අනිත්‍යාදී වශයෙන් ලක්ෂණ ප්‍රතිවේදයට ද මතුවෙහි සෝවාන් ආදී මාර්ගයන්ට පමුණුවන ප්‍රඥාව විවිධාකාරයෙන් ප්‍රකට කොට දැනී යන අර්ථයෙන් ද ප්‍රඥා යැයි කියනු ලැබේ. භෞතික විශ්වයෙහි කිසිවක් තුළ නිත්‍ය බවක් නොමැත. සියලු සංස්කාර අනිත්‍ය බව බුදු වදනයි. යමක් අනිත්‍ය නම් එය සුඛයක් නොවේ. එහෙයින්ම එය මහා දුකකි. ආත්ම වශයෙන් ගැනීම ද බුදු දහම ඉඳුරාම ප්‍රතික්ෂේප කරයි.

ප්‍රඥාව විවිධාකාරය. අධිප්‍රඥා යනු ක්‍රමයෙන් දියුණු වන ප්‍රඥාවයි. ලෝකයෙහි යථා ස්වභාවය පිළිබඳ නුවණයි. නාම, රූප දෙකේ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ත්‍රිලක්ෂණය දැනීම නම් වූ සාමාන්‍ය ලක්ෂණය හා නාමය නම් අරමුණු කෙරෙහි නැමෙන ස්වරූපය බව ද, සීත, උෂ්ණ ආදියෙන් රූපය විනාශ වන බව ද, එසේ වනුයේ නාම, රූප දෙකේ විශේෂත්වය නිසා බව ද ඇති සැටියෙන් දැන ගැනීම ද ප්‍රඥාව නම් වේ. මෙම ප්‍රඥාව යනු ලෞකික බුද්ධිය නොවේ. ලෝකයේ යථා ස්වභාවය පිළිබඳ නුවණයි.

සත්ව ලෝකයෙහි ඇති සනාථන ධර්මය නම් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන තුනයි. මේ ත්‍රිලක්ෂණය දෙස යථාභූත වශයෙන් දැනගත් විට ආත්මයක් පිළිබඳ සංකල්පය හට නොගනී. සියලු සංස්කාරයන්ගේ අනිත්‍ය බව බුදු සමයේ පිළිගැනීමයි. යමක් අනිත්‍ය නම් කිසිවක් සුඛ බවට පත්විය නොහැකි අතර, සියල්ල දුක් සහිත බව වටහා ගත යුතුය.

සිල්වත්ව, ශික්ෂා පදයන්හි හික්මී කාමයෙන් වෙන්ව ධ්‍යානයන්ට එළඹ විශිෂ්ට ඥානය ප්‍රත්‍යක්ෂ කොට අධිප්‍රඥා ශික්ෂාව වැඩිය යුතු වේ. චෛතසික වීර්‍යයෙන්, කායික වීර්‍යයෙන් ධෛර්‍යමත්ව ධ්‍යාන පුරා අධිශීල, අධිචිත්ත, අධිප්‍රඥා යන ත්‍රිවිධ ශික්ෂාවන් පිරිය යුත්තේය. දිට්ඨිවිසුද්ධිය ප්‍රඥාවේ ආරම්භයයි. දිට්ඨිවිසුද්ධිය හා කංඛාවිතරණ විසුද්ධිය රැක, මග්ගාමග්ග ඤාණ විසුද්ධිය, පටිපදා ඤාණදස්සන විශුද්ධිය, ඤාණදස්සන විසුද්ධිය තුළින් ප්‍රඥාවේ ඒ ඒ අවස්ථා පූරණය කොට අවසාන ප්‍රතිඵලය වූ ප්‍රඥාව වැඩීමෙන් ලබන අරහත්වය සාක්ෂාත් කර ගත හැකි වේ.

ප්‍රඥාව ඇති කර ගැනීම සඳහා බුදුන් වහන්සේ පෙන්වා වදාළ මාර්ගය තේරුම් කොට ගෙන ජීවිතය පිළිබඳ මමත්වය අතහැර දා ප්‍රඥාව වැඩිය යුතුය. ප්‍රඥාව ඇති වන්නේ නුවණින් ආර්‍ය සත්‍යය විමසීමෙන්, යෝනිසෝමනසිකාරයෙන් යුතුව නුවණින් කල්පනා කිරීමෙනි. ජීවිතයේ යථාර්ථය දැකීමට ගන්නා උත්සාහය ප්‍රඥාව වශයෙන් හඳුනාගත හැකිය. ඒ සඳහා ධර්මය දැන නිවනට හේතු වන්නා වූ ප්‍රතිපත්ති මාර්ගයෙහි යෙදීමෙන් ප්‍රඥාව පිරිසිඳ වඩාගත යුතුය. රාග, ද්වේශ, මෝහ ආදී සසර ගමන දික් කෙරෙන ක්ලේශ ධර්මයන් ප්‍රහාණය කිරීමෙන් තමා තුළින්ම ආධ්‍යාත්මිකව ලබා ගත යුතු සත්‍යයකි. ප්‍රඥාව යනු බාහිර ලෝකයෙන් ලබන දැනුම නොවේ. බාහිර ලෝකයෙන් ලබන දැනුම වහා වෙනස්වන සුළුය. ප්‍රඥාව පහළ වන්නේ කෙලෙස්මලින් දුරු වූ විටය. මනස අපිරිසිදු නම් ප්‍රඥාව පහළ නොවේ. ප්‍රඥාව වහා වෙනස් නොවේ.

බාහිරව ලබා ගන්නා ඥානයෙන් සිදු කෙරෙන්නේ විවිධ ක්‍රියාකාරිත්වයන් පිළිබඳව දැනුම එක්රැස්කර ගැනීමයි. එසේ රැස්කර ගන්නා වූ උගත්කම ප්‍රඥාව වශයෙන් නොසැලකේ. හුදෙක් අපිරිසිදු ක්ලේශ ධර්මයන් ඉවත් කිරීමෙන්ම ප්‍රඥාව වඩා ගත හැකි වෙයි. ධම්මානුධම්ම පටිපදාවෙන් කෙලෙස් දහම් දුරු කිරීමෙන් ප්‍රඥාව නමැති ශක්තිය උදා කර ගත හැකිය. නිවන අවබෝධ කර ගැනීමට නම් ප්‍රඥාව අවශ්‍යමය. ධම්මචක්කපවත්තන සූත්‍ර දේශනාවේ දී චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි යනුවෙන් දැක්වූ උදාන වාක්‍යයේ, ඇස පහළ වීමෙන්, ඥානය පහළ වීමෙන් අනතුරුව ප්‍රඥාව නමැති ශක්තිය ලැබෙන බව පැහැදිලිය. ඕනෑම කෙනෙකුට දැනුම හෙවත් ඥානය ලබා ගත හැකිය. එහෙත් ප්‍රඥාව එසේ සැම කෙනාටම පහසුවෙන් ලබා ගත හැකි ශක්තියක් නොවේ. ප්‍රඥාව ලබා ගැනීමට නම් තම චිත්ත සන්තානයෙන් පවත්නා කෙලෙස් ප්‍රහාණය කළ යුතුවම පවතී. තමන් තුළ පවත්නා අපවිත්‍ර සිතුවිලි සෝදා හැරීමෙන් මිස ප්‍රඥාවක් පහළ නොවේ. ප්‍රඥාව වනාහි නොවනස්වන දහමකි. ඥානය වෙනස් වේ. අලුත් වේ. ප්‍රඥාව පහළ කර ගැනීමට නම් ධර්මඥානය මහත් සේ උපකාරී වේ. ශ්‍රද්ධාව ද ඊට අනුකූලව අවශ්‍ය වේ. ධර්ම ඥානය ලැබූ තැනැත්තා ලෞකික වශයෙන් ඇති වන්නා වූ ආස්‍රවයන් ඉවත් කොට - ප්‍රහාණය කොට උත්සාහවත් විය යුතු වෙයි. ප්‍රඥාව වනාහි ප්‍රායෝගිකව දැඩි අධිෂ්ඨානයෙන් යුතුව ඇති කර ගත යුත්තකි.

බුදුරජාණන් වහන්සේ බුද්ධත්වය පිණිස සපුරා ගත් දස පාරමිතාවන්ගෙන් අන් සැම පාරමිතාවකටම බලවත් සාධකය වූයේ ප්‍රඥා පාරමිතාවයි. ලෝක සත්වයන් ඇසින්, කනින්, නාසයෙන්, දිවෙන්, කයෙන් හඳුනාගන්නා අරමුණු හා සාමාන්‍ය දැනීම් වලට වඩා ප්‍රඥාව වැදගත් වේ. පින් පවු, හොඳ නරක, යහපත අයහපත, හේතු ප්‍රත්‍යය දැනගත හැකි වන්නේ ප්‍රඥාවෙනි. ස්කන්ධයන් හා ආයතන සත්‍ය වැනි ගැඹුරු ධර්මතා දැනගත හැක්කේ ද ප්‍රඥාවෙනි. දත යුතු දේ ඇති සැටියෙන් දැන ගැනීම ප්‍රඥාවේ ලක්ෂණයයි. ලෞකික, ලෝකෝත්තර වශයෙන් ප්‍රඥාව දෙයාකාරය. ලෞකික ප්‍රඥාව, කාමවචර, රූපාවචර, අරූපාවචර සිත්වල හටගනී. සතර මාර්ග, සතරඵල චිත්තයෙහි ලෝකෝත්තර ප්‍රඥාව හට ගනී. පෙරුම් පිරීමෙන් සම්බෝධියට පැමිණෙන්නේ ලෝකෝත්තර ප්‍රඥාවෙනි.

ප්‍රඥාව ඇති වීටම හේතු බොහෝය. ත්‍රිහේතුක ප්‍රතිසන්ධිය, ප්‍රඥාව පතා කළ පින් ඇති බව, වැඩුණු ශරීර ඇති බව, නිරෝගී බව, අතීත අකුසලකර්ම නැති බව, නානා ශිල්ප ශාස්ත්‍ර දන්නා බව, ධර්මය දන්නා බව, විමසන බව, නුවණ මෙහෙයා කළ යුතු කර්මාන්තවල යෙදෙන බව, දහම් දෙසීම, දහම් ඇසීම, ගැඹුරු ධර්මය කල්පනා කිරීම, පණ්ඩිතයන් හා සාකච්ඡා කරන බව, පණ්ඩිතයන් ඇසුරු කරන බව, මෝඩයන්ගෙන් දුරුව වාසය කරන බව, සමාධිය වැඩීම, කෙලෙස් ප්‍රහීණ කිරීම, ප්‍රඥාව වැඩෙන බව යන මේවා ප්‍රඥාව ඇති කර ගැනීමට බොහෝ සෙයින් හේතු වේ. ප්‍රඥාවට බාධක වන කරුණු අතර පංචනීවරණයන් ප්‍රධාන වේ. කාමච්ඡන්දය, ව්‍යාපාදය, ථීනමිද්දය, උද්දච්චකුක්කුච්චය, විචිකිච්ඡාව යන අකුසල ධර්මයන් ප්‍රඥාව දුබල කරයි. නීවරණ පසින් කාමච්ඡන්දය හා ව්‍යාපාද වඩාත් බාධකය. ප්‍රඥාවෙහි උත්සාහ කරන්නා ප්‍රඥාවේ ගුණ මෙනෙහි

"යම් තැනක සිට පවේ විපාකයෙන් මිදිය හැකිද එබඳු තැනක් අහසෙහිත් නැත. මුහුදු මැදත් නැත. පර්වත කුහරයකවත් නැත. එබඳු බිම් පෙදෙසක් ලොව කොහේවත් ඇත්තේ නැත."

කළ යුතුය. ප්‍රඥාවේ ඇති ගුණ බොහෝය. බුදු, පසේබුදු, මහරහත් යන ලෝකෝත්තර ප්‍රඥා තුනෙන් ප්‍රඥාවේ අග්‍රඵලය නෙළා ගත හැකිය.

ලෝකෝත්තර ප්‍රඥාව ඇති වන්නේ ලෞකික ප්‍රඥාවෙනි. ඥානයෙන් තොරව ප්‍රඥාව ලද නොහැකිය. කවර පුණ්‍ය කටයුත්තකදී වුව ඥානය මුල් වේ. දාන, ශීල, භාවනා සියල්ලෙහිම කිළිටු බව ප්‍රඥාවේ හීන බවින් ඇති වේ. ලෝභ, ද්වේශ, මෝහ ආදියෙන් තොරව මනා සේ සිල් රැකිය හැක්කේ ප්‍රඥාවෙන් යුක්ත වූවන්ටය. ප්‍රඥා පාරමිතාව පිරීමට උත්සාහවත් වන තැනැත්තන් ප්‍රඥාවට බාධක කරුණු වලින් දුරු වී ප්‍රඥාවට හේතු වන දෑ සේවනය කළ යුතුය. චතුරාර්ය සත්‍ය, පටිච්චසමුප්පාදය, සතිපට්ඨාන ආදී



බෝධිපාක්ෂික ධර්මයන් උගත යුතුය. ත්‍රිපිටක ධර්මය හැකිතාක් උගත යුතුය. භාවනාවෙහි යෙදී සමාධිය ඇති කර ගත යුතුව පවතී. සමාධිය වැඩීමෙන් රූපාවචර, අරූපාවචර ධ්‍යාන ඇති කර ගත යුතුය. පඤ්ඤාභිඤ්ඤා උපදවා ගත යුතු වේ. ධන ධාන්‍ය අඹුදරුවන් කෙරෙහි ඇති තෘෂ්ණාව දුරු කිරීම, ප්‍රඥාව වැඩීමට උපකාරී වේ.

ශ්‍රවණය කරන ලද ධර්ම කරුණු තමාම තේරුම් ගෙන ප්‍රත්‍යක්ෂ කර යථාවබෝධය ලබා තමාගේම මනස තුළින් මතුවන්නා වූ අරමුණු මැන බැලීමත් පිරිසිදු කර ගැනීමත් කර ගත යුතුව ඇත. අරමුණු රාගයෙන් ඇලීමෙන් ද්වේශයෙන් ගැටීමෙන් මෝහයෙන් මුලාවීමෙන්, තෝරා බේරා වෙන් කර පිරිසිදු කර අපිරිසිදු ධර්මයන් වෙන් කර නිදහස් වීමට, ප්‍රඥාව තිබිය යුතුය. බැඳීම් අතහැර නිදහස් වීමේ ශක්තිය ප්‍රඥාවෙන් ලැබේ. දුක, නිවන ආදිය පිළිබඳව දැන ගන්නා දැනුම ප්‍රයෝජනයට යොමු කොට විපස්සනා නුවණින් දැක තමා තුළ මුල් බැස ගෙන ඇති කිළිටි ඉවත් කර ප්‍රඥාව ඇති කර ගැනීමෙන් නිවන සාක්ෂාත් කර ගත හැකිය. නුවණ පමණක් ඇති තැනැත්තා ලෞකිකත්වය තුළින් සාරවත් හා අසාරවත් යන දෙකම එකතු කර ගනියි. ප්‍රඥාව ඇති තැනැත්තා අසාරවත් අයහපත ඉවත් කොට සියලු පිරිසිදු පවිත්‍ර නිකෙලෙස් දෑය එකතු කර ගනී. මේ අනුව ප්‍රඥාව නිසා නිවීමක් ඇති කර ගත හැකිය. නිවන් දැකීමට අධිෂ්ඨාන කර ගන්නේ නම් ප්‍රඥාවෙන් තොරව සත්‍ය ඥානය ලබා ගත නොහැකිය. විදර්ශනා ඥානය තුළින් මෙම ප්‍රඥාව උපදවා ගත හැකිය. ද්වේශය, වෛරය, තරහව, මෝහය ව්‍යාපාදය ආදිය දුරු කොට මෛත්‍රී, කරුණා, මුදිතා, උපේක්ෂා යන සාරවත් ගුණ සිතෙහි ඇති කර ගත හැකි නම් ප්‍රඥාව වැඩීමට පහසු වේ. චිත්ත සන්තානය විපිළිසර වන්නේත්, උද්දච්ච කුක්කුච්ඡයට නතු වන්නේත්, බයට, වේදනාවට පත්වන්නේත් රාග, ද්වේශාදී කිළිටු ධර්ම සිතට ඇතුළත් වීමෙනි. මෝහය, මෝඩකම ආදී ලාමක ගති නිසා ප්‍රඥාවට ඇති මග වසා දමයි. ලෝභයෙන්, ද්වේශයෙන් තොර වූ අව්‍යාපාද තත්ත්වයක් ඇති කර ගැනීමට තම ශක්තියෙන්ම ප්‍රඥාව ඇති කර ගැනීමෙන් . හැකි වේ. චිත්ත සන්තානය අඳුරු කෙරෙන ධර්ම සංසාර ගමන දික් කිරීමට හේතු වේ. එබැවින් කාමාශාව, භවාශාව ආදී ආශ්‍රවයන් මගහරවා ගැනීමට ප්‍රඥාව ඉවහල් කර ගත යුතු වේ.

ශීලයෙහි පිහිටා කටයුතු කිරීමෙන් සිතුවිලි පිරිසිදු වී, ඉන්ද්‍රියන් සංවර කර ගැනීමෙන් විපස්සනා ඥානය පහළ කර ගැනීමෙන් ප්‍රඥාවේ ශක්තිය වර්ධනය කර ගත හැකි වේ. ප්‍රඥාව වඩා වර්ධනය කර ගැනීමෙහිලා කල්‍යාණ මිත්‍ර ඇසුර ද උපකාරී වේ. කල්‍යාණ මිත්‍ර සම්පත්තිය නොමැති විට නිවන් මග වැසී යන බව බුද්ධ දේශනාවයි. කල්‍යාණ මිත්‍රයා ඇසුරෙන් කෙලෙස් දහම් මගහරවා ගැනීමට උපකාරී වේ. සත්වයා සංසාර ගමනේ ඇලෙන්නේ රාග ද්වේශාදී කෙලෙස් ධර්ම නිසාය. ඒවායින් නිදහස් වීමට නම් ප්‍රඥාවෙන් යුතුව කුසලයන් සම්පාදනය කර ගත යුතුය.

ප්‍රඥාවේ ශක්තිය කුසල් පූරණය කර ගැනීමට අතිශයින්ම අවශ්‍ය වේ. අකුසලයන් බැහැර කිරීමට ප්‍රඥාව බොහෝ සෙයින් ඉවහල් වේ. ප්‍රඥාව බුද්ධ ඥානය මතු කොට විමුක්තිය ලබා ගැනීමට ඇති මාර්ගයයි. නිවන් දැකීමට අවශ්‍ය නම් චිත්ත සන්තානයේ පවත්නා සියලු අකුසලයන් පිළිබඳ මුල් සිඳ දැමිය යුතුය. මේ සඳහා අනුගමනය කළ යුතු පියවරයන් ශීල, සමාධි, ප්‍රඥා වශයෙන් විග්‍රහ කොට දැක්වේ. මේ ධර්ම තුනෙන්ම කිළිටු ධර්ම ඉවත් කර පිරිසිදු ධර්ම ඇති කර ගැනීමට මග සැලසෙයි. සෝතාපන්න මාර්ග යේ දී සංවේදන හා දිට්ඨාංසය හා විචිකිච්චාංසය සහමුලින් දුරු වී යයි. අපිදු මෙම උතුම් පොහෝ දිනයෙහි පටන් නිවන් මග පසක් කර ගැනීමේ අරමුණින් සීල, සමාධි ගුණ පූරණය කොට සැදැහැ සිතින් ප්‍රඥාව වඩා ගැනීමට දිරිමත් වෙමු.

''යමෙක් මුලදී පමා වුවත් පසුව නොපමා වේද ඔහු වලාකුළින් නිකුත් වූ සඳක් මෙන් මේ ලෝකය බබුළුවයි.''

කාලීන ධර්ම සාකච්ඡා



# අප නිවන ප්‍රාර්ථනා කළ යුත්තේ කිනම් කාලයකද?

# ගිහි නිවසක වස් වැසීම භික්ෂුවකට තහනම්ද?

## පූජ්‍ය ඉඟුරුවත්තේ පියනන්ද නාහිමිපාණන්ගෙන් අසමු

❐ බෞද්ධයන් වශයෙන් අපි මෛත්‍රී බුද්ධ ශාසනයෙහි නිවන් දැකීමට ප්‍රාර්ථනා කළ යුතුද? අපට මෙම ශාසනයේ නිවන් දැකීමට නොහැකිද?

කවර බුද්ධ ශාසනයක නමුදු නිවන් දැකීමට නම් හුදු ප්‍රාර්ථනාවම කිසිසේත් ප්‍රමාණවත් නොවේ. ඒ සඳහා පාරමී හෙවත් විද්‍යා චරණ සංඛ්‍යාත ගුණ නුවණ දියුණු කළ යුතුමය. නොහොත් දන සීලාදී පුණ්‍ය කර්මයන් මෙන්ම ධර්ම ශ්‍රවණය කිරීම, පංචස්කන්ධය පිළිබඳව නුවණින් මෙනෙහි කිරීම, සතර සතිපට්ඨාන ධර්ම විෂයෙහි යෝනිසෝ මනසිකාරය පැවැත්වීම පුරුදු කළ යුතුය. එපමණක් නොව යම් යම් සමථ භාවනා ක්‍රමද පුරුදු කිරීම අවශ්‍යය.

ගෞතම බුද්ධ ශාසනය නිර්මලව පවතින මෙම කාලයේ නිවන් මග වැසී ඇතැයි කිසිසේත්ම කිව නොහැකිය. සතර සතිපට්ඨාන ධර්ම වඩනා තාක් කල් නිවන් මග විවෘතය. ඒත් පුහුදුන් සිත් විවිධ මිථ්‍යා ක්ලේශ ධර්මයන්ගෙන් වරින් වර කිළිටි වේ. විතර්ක සැක සංකා කුකුස් පහළ වේ. මෙයට හේතු වනුයේ පෙළ දහමින් පරිබාහිරව යම් යම් පුද්ගලයන් අත්තනෝමතිකව නිවන් මග හා නිවන පිළිබඳ ලියන පොත පත හා දේශන යැයි මා සිතමි. පිරිසිදු නිවන් මග හා නිවන පිළිබඳව පැහැදිලි කරන දේශනා සහ සාකච්ඡා බෙහෙවින් විරලය. නූතනයෙහි ගිහි පැවිදි දේශකයන් විසින් කරන ධර්ම දේශනා බෙහෙවින්ම යම් යම් ධර්ම කරුණු පිළිබඳව අර්ථකථන හා විවේචනයන්ගෙන් ගහණය. ඒවා ව්‍යාකූලද, අක්‍රමවත් බවක්ද පෙන්නුම් කරයි. එපමණකුදු නොව නූතන බෞද්ධයන් පිළිබඳව පොදුවේ ගත් කළ අවංකවම තම පංචස්කන්ධය පිළිබඳව එහි ආදීනව සහ විශේෂයෙන් දුක්ඛ සත්‍යය පිළිබඳ දැනුම අල්ප හෙයින් පංචස්කන්ධය පිළිබඳ අවබෝධ අඩු හෙයින් දුකින් මිදීමේ නොහොත් නිවන ප්‍රත්‍යක්ෂ කිරීමේ අවංක අදහස් ඇත්තේ ඉතාම සුළු පිරිසකටය. එමනිසා නිවන පිළිබඳ දුර්මත, ව්‍යාකූල සංකල්පනා අපගේ සිත් තුළ තැන්පත්ව ඇත.


නූතනයෙහි කෙරෙන ධර්ම දේශනා මාධ්‍යය පිළිබඳව තවදුරටත් අප මඳක් විමසා බලමු. මෙතෙක් අප ඇසූ ධර්ම දේශනාවන් පිළිබඳව විමසිලිමත්ව බලන්න. තම සන්තානය තුළ සන්සුන් බවක්, තැන්පත් බවක් සාමාන්‍ය මට්ටමෙන් හෝ

''සුචරිතයෙහි හැසිරිය යුතුය. දුශ්චරිතයෙහි නොහැසිරිය යුතුය. ධර්මයෙහි හැසිරෙන්නා මෙලොව පරලොව දෙකෙහිම සුවසේ වෙසේ.''

සීල සමාධි ප්‍රඥා හට ගැනීමේ පූර්ව දැනුමක් හෝ ඇතිවීද කියා. නොඑසේ නම් සිදුවී ඇත්තේ යම් යම් ධර්ම කරුණු පිළිබඳව දැනුමක් ලැබීම නොවේද? ගිහි පැවිදි සුළු පිරිසක් දුකින් මිදීමේ ඒකායන අපේක්ෂාවෙන් තරමක් හෝ සමථ විදසුන් වැඩීමේ යෙදුණද බොහෝවිට පවතින සමාජ සංකීර්ණත්වය හමුවේ අඛණ්ඩව වීර්යය කරගෙන යාමට බාධා පැමිණෙන හෙයින් දහම් ඇස පහළ කරගැනීමේ අවස්ථාව උදාකර ගැනීම දුෂ්කර බව පෙනේ. විශේෂයෙන් බුරුම දේශය පිළිබඳව විමසා බලන විට එහි ගිහි පැවිදි බොහෝ පිරිස් විශේෂයෙන් භික්ෂූන් වහන්සේලා විහාරස්ථාන පිළිබඳ ඇලීම්, බැඳීම්වලින් දුරස් වී සති ගණන්, මාස ගණන්, අවුරුදු ගණන් වීර්යය වඩන අවස්ථා අසන්නට, දකින්නට ලැබේ. ඒ නිසාම පළමුවන, දෙවන, තුන්වන දහම් ඇස පහළ කර ගත්තෝද සිටින බව කිව හැකියි. රහතන් වහන්සේලාද නොසිටිතැයි කිව හැකි නොවේ. අප රට තුළද ප්‍රථම දහම් ඇස හෝ පහළ කරගත් ගිහි-පැවිදි අය සිටිය හැකියි. එහෙත් සෑහෙන කලක සිට මෙරට ව්‍යාප්තව පැවැති පිරිසිදු විදර්ශනා ආකූල ක්‍රමය ව්‍යාකූල කරමින් තම මත සංකලනය නොව භාවනා ක්‍රම ඉදිරිපත් කරන නවක කර්මස්ථාන ගුරුවරුන් නිසා නැවතත් ගමන් මග ව්‍යාකූලත්වයෙන් ගහණ වෙමින් පවතින බව පෙනේ. මේ බුද්ධ ශාසනයේ වරදක් නම් නොවේ.

# සිල් සමාදන් වූ දිනයේ පාවහන් පැළඳීම නොකළ යුතුද?

# ගිහි නිවසක දානය පිරිනැමීමේදී කරඬුව වැඩමවීම අත්‍යවශ්‍යද?



කාමයන්ගෙන් අන්ධ වී අසංතෘප්ත ජීවිත ගෙවමින් කම්සුව විඳුම ජීවිතයේ පරමාර්ථය කරගත් අන්ධ ප්‍රථජ්ජන භාවයේ ගැලී සිටින බොහෝ නාමික බෞද්ධයන්ට නිවන් මග තබා ඒ පිළිබඳ පැහැදිලි විඥානයක් හෝ ඇතැයි කිව හැකිද? නොහැකිය. ඉතින් නිවන් මග හෝ නිවන පිළිබඳ කුමන කතාද? පුන පුනා කිව යුත්තේ මෙරට භික්ෂු සමාජයද අති බහුතරයක් අතර පවතිනුයේ නිවන හා නිවන් මග පිළිබඳව ඇල්මැරුණු ස්වභාවයකි. අද අදම දුකින් මිදීම පිළිබඳව ඇත්තේ සිහිනමාත්‍ර විශ්වාසයකි. එය දිගු කලක සිට බෞද්ධ සමාජය තුළ වපුරා ඇති දැන් නිවන් දකින්න බෑ, මෛත්‍රී බුද්ධ ශාසනයේදී එය සිදුවේවි යනාදී මිත්‍යාවන් නිසා සිදු වූවකි. එම නිසයි ගෞතම බුද්ධ ශාසනය පිළිබඳව ඉච්ඡා භංගත්වයට පැමිණ මෛත්‍රී බුද්ධ ශාසනයට නිවන බාරදී ජාම් බේරා ගැනීමට කතා කරන්නේ. මේ මහා භද්‍ර කල්පයෙහි සිව්වන තැන හිමිව ඇත්තේ ගෞතම බුදුරදුන්ටය. පස්වැනි මෙන්ම මේ භද්‍ර කල්පයේ අවසාන බුදුරදුන් මෛත්‍රී බුදුරජාණෝය. යමෙකුට මේ ජීවිතයේදී නිවන් දැකීම සඳහා පිරිසිදු චේතනාවක්, දුකින් මිදීමේ අව්‍යාජ උත්සාහයක් නොමැති නම් කෙතරම් නිවන පැවතුවද මෙත් බුදුරදුන් දවසද ඔහුට හිමිවනුයේ අන්ත පරාජයකි. එදාටද අනාගතයෙහි පහළ වන බුදුවරයකු පිළිබඳ ප්‍රාර්ථනයකි. එබැවින් එම අන්තිම අවස්ථාව (චාන්ස් එක) ගිලිහී ගියහොත් නැවත කල්ප පනස් එකකින් මොබ බුදු පියසක් හමු නොවනු ඇත. අතිශය දීර්ඝ කාල පරාසයක් ලෝකය තෙරුවන්ගෙන් හා විදර්ශනාවන්ගෙන් ශූන්‍යව පවතී. එවිට අපේ නිවන කියා නිමකළ නොහෙන දීර්ඝ සංසාරයට නැවතත් වැටෙනු ඇත. ඒ දීර්ඝ කාල පරිච්ඡේදය තුළ අප මොන මොන කර්ම කොට කුමන කුමන ලෝකවලට තල්ලු වී යාදැයි කිව හැක්කේ කාටද? එමනිසා අති පණ්ඩිතයන්ගේ අති

ධාවනකාරීන්ගේ ගොඩට නොවැටී සසර බිය උපදවාගෙන දුකින් මිදීමේ පිරිසිදු චේතනාවෙන් අද අදම සතිපට්ඨාන ධර්මයන් ප්‍රගුණ කොට අවම වශයෙන් චුල්ල සෝතාපන්නයෙක් හෝ වීමට උත්සාහ කරන්න.

**❒ ගිහි නිවසක භික්ෂුවක් වස් වසවා ගැනීම සුදුසුද?**

ගිහි පින්වතුන් පදිංචිව සිටින නිවසක එක් වහලක් යට උපසපන් භික්ෂුවකට දවසට, දෙකකට වඩා වාසය කිරීමට විනය නීතිවලට අනුව ඉඩක් නැත. කාන්තාවන් වෙසෙන නිවසක නම් එසේ වාසය කිරීමට සුදුසු නැත. අනුසම්පන්න සාමණේරාදීන් සමග වුවද එක් නිවසක, එක් ආවාසයක, එක් කුටියක වාසය කළ හැකි ආකාරය ''යො පන භික්ඛු අනුසම්පන්නේන දිරත්ත තිරත්තං සහසෙය්‍යං කප්පෙය්‍ය පාචිත්තියං'' යන විනය නීතියට අනුව දෙතුන් රැයකට වඩා එක් වහලක් යට විසීම නුසුදුසු බව දැක්වේ.

ගිහි නිවසක ගිහි පක්ෂය පදිංචි වී නැති නම් වරදක් නැත. මහල් නිවසක එක් මහලක ගිහියන් වාසය කළද, භික්ෂුව වස් වසවා ගන්නා කොටසේ ගිහි පින්වතුන් පදිංචියක් නොමැති විටක වරදක් නොපෙනේ. එබඳු සුදුසුකම් තිබුණේ නමුත් එම නිවස ආසන්නයේම තැබෑරුම්, ගණිකා නිවාස, සූදු පොළවල් යනාදිය පවතී නම් භික්ෂුවක් එහි වාසය සඳහා අයෝග්‍ය බව කිව යුතුයි. මෙම කරුණු සැලකිල්ලට ගෙන භික්ෂුවක් වස් වසවා ගැනීමේදී කටයුතු කිරීම සුදුසුය.

**❒ සිල් සමාදන් වූ දවසට පාවහන් දැරීම සුදුසුද?**

පාවහන් හෙවත් සෙරෙප්පු, සපත්තු පාවිච්චි කරනුයේ විවිධ හේතූන් මුල් කරගෙනය. ශීතාධික රටවල වෙසෙන අය ශීතලෙන් ආරක්ෂාවීම පිණිසද, පාවල ආබාධ ඇති අය පා ආරක්ෂා කරගැනීම පිණිසද, විෂබීජ සහිත පරිසරයක ඇවිදීමේදී ඒවායෙන් පා ආරක්ෂා කරගැනීම පිණිසද පාවහන් පළඳී. ඇතැම් අය එබඳු කිසිදු අවශ්‍යතාවක් නැතිව වුවද ඇඳුම් පැළඳුම් අංග සම්පූර්ණ වීම සඳහා පාවහන් පළඳී. ගිහියන් සතු එබඳු ක්‍රියා පිළිබඳ අපට කිව යුත්තක් නැත. බොදුනුවන් පමණක් නොව අති බහුතරයක් ආගමිකයන් පල්ලි, කෝවිල් යනාදී ආගමික ස්ථානවලදී පාවහන් ඉවත් කොටගෙන එම ශුද්ධ භූමිවල කටයුතු කරන ආකාරය ඉතාමත් පැහැදිලිය. මුස්ලිම්, හින්දු වැනි බැතිමතුන්ගේ ආගමික ස්ථානවල හැසිරීම සලකා බලන්න. බෞද්ධයන්ගේ පූජනීය ස්ථාන වන චෛත්‍ය, බුදු මැදුර, බෝ මළුව, සංඝාවාසය වැනි ස්ථානවලට ප්‍රවේශවීමේදී හිස් වැසුම්, පා වැසුම් ගලවා එහි ඇතුළුවීම එම ස්ථානවලට කරන ගෞරවයක් මෙන්ම උතුම් චාරිත්‍ර ධර්මයකි. අපේ පැරණි බෞද්ධයෝ සෑ මළු, බෝ මළු පමණක් නොව සඟ සතු භූමිය පවා පූජනීය ස්ථානයක් සේ සලකා හිස් වැසුම්, පා වැසුම් ගලවා එහි ඇතුළු වූ බව පෙනේ.

සිල් සමාදන් වූ දවසේදී පවා පාවල ආබාධයක් නොමැති නම් පාවහන් නිවසේ තබා පාවහන් රහිතව එම කටයුතුවලට සහභාගිවීම ඉතා සුදුසු යැයි කිව හැකියි. වැසිකිළි, කැසිකිළි ආදියට පාවහන් පාවිච්චිය වරදක් නොවේ. පාවහන් රහිතව ඇවිදීමේ අපහසුවක් හෝ තුවාල ආදී ආබාධයක් නොමැති නම් විහාරස්ථානයේදී පාවහන් පාවිච්චි නොකර සිටීම වඩාත් සුදුසුය.

අද ඇතැම් බෞද්ධයන් පාවහන් පැළඳීම විලාසිතාවක් ලෙස සිදු කරනු පෙනේ. ඇතැමුන් පාවහන් ගලවනුයේ විහාර, චෛත්‍ය, බෝමළු ආදියේ පඩිය මතය. එය නුසුදුසුය. ඇතැම් විට එය පවක් වීමටද පුළුවන. නොසැලකිලිමත් ලෙස පූජනීය ස්ථානවල පාවහන් පැළඳීම නිසා බිම්සර රජුට විපාක අත්විඳීමට සිදුවූ ආකාරය අප අසා ඇත්තෙමු. එබඳු අවිචාරවත් පුද්ගලයන්ගේ ආගමික ස්ථානවල ගරුත්වය රැකගැනීම සඳහා ප්‍රසිද්ධ ස්ථානවල දැන්වීම් පුවරු යොදා ඇති බවද පෙනේ.

**❒ ගිහි නිවසක සාංඝික දානයක් පිරිනැමීමේදී කරඬුව වැඩමවීම අත්‍යවශ්‍යද?**

අපේ සූත්‍ර පිටකයෙහි එන දාන පිළිබඳව පැහැදිලි කෙරෙන සූත්‍ර අතරින් වැදගත් සූත්‍ර දෙකකි 'දක්ෂිණා විභංග, දක්ෂිණා විසුද්ධි' යන සූත්‍ර දෙක. එම සූත්‍ර හා අටුවා විස්තරයට අනුව සාංඝික දාන සතකි. එයින් වර්තමානයේ සිදුකළ හැක්කේ තුන්වෙනි අංකයට ගැනෙන භික්ෂු සංඝයා සඳහා දෙන දානය හා සයවෙනි අංකයට ගැනෙන සඟින් සංඝයා ලබාගෙන සඟුන් උදෙසා දෙන දානයයි.

අටුවා විස්තයට අනුව බුද්ධ පරිනිර්වාණයෙන් පසු සධාතුක කරඬුව ගෞරවයෙන් වැඩමවා බුද්ධ ශාසනය මත එය තැන්පත් කොට දාන වස්තුවේ අග්‍ර භාගය බුදුරදුන් උදෙසා වෙන්කර තබා අනතුරුව මහා සංඝයාට දානය පූජා කිරීම බෙහෙවින් සුදුසු බව කිව හැකියි. එය අද යුගයට අනුව බුද්ධ ප්‍රමුඛ මහා සංඝයාට පිරිනමන සාංඝික දානය ලෙස සැලකිය හැකියි. එබඳු සාංඝික දානයක් සඳහා සධාතුක කරඬුවා වැඩමවා ගත නොහැකි නම් සුදුසු තැනක බුද්ධ පූජාව තබා මහ සඟරුවන උදෙසා දන් පිරිනැමීමෙන් අඩුවක් නැත. සධාතුක කරඬුව නොමැතිවීම සාංඝික දානයට අඩුවක් යැයි නොසිතිය යුතුය.




එහෙත් හැකියාව, පහසුව තිබේ නම් සධාතුක කරඬුවක් වැඩමවා ඒ අභියස සංඝයා වඩා හිඳුවා දන් පිරිනැමීම වඩාත් සුදුසුය.

**❒ ස්වාමීන් වහන්ස, පොහෝ දිනවල පෙහෙවස් සමාදන්ව සිටින උපාසක උපාසිකාවන් තේ, කෝපි වැනි යම්කිසි පාන වර්ගයක් ගැනීමේදී ඔවුන්ගේ සිත යම් වින්දනයකට (රස තෘෂ්ණාවට) අසුවේ යැයි සිතමි. එබැවින් එදිනට තේ, කෝපි යන පාන වර්ග ගැනීමෙන් වැළකීම සුදුසුයි නේද?**

පෙහෙවස් සමාදන්වී එය ආරක්ෂා කිරීමේදී සිදුවනුයේ විශේෂයෙන් කාය වාග් සංවරය ඇතිවීමයි. ශික්ෂාපද ශීලය ආරක්ෂා කරගත් පමණින් සිත පිළිබඳ මනා සංයමයක් කෙලෙසවත් ඇති නොවේ. අප කෙලෙස් සහිත බැවින් ආහාරපාන, ගිලන් පස යනාදිය ගැනීමේදී ස්වල්ප වශයෙන් නමුදු වින්දනාත්මක සිත් පහළ විය හැකියි. එමනිසයි විශේෂයෙන් භික්ෂූන් වහන්සේලාට සිව්පස පරිභෝගයේදී ප්‍රත්‍යවේක්ෂාව හෙවත් නුවණින් සිහි කරමින් පරිභෝගය (පිළිකුල් වශයෙන් හෝ ධාතු වශයෙන් හෝ) අනුදැන වදාරා

''ආශාව නිසා ශෝකය හටගනී. බිය හට ගනී. ආශාවෙන් වෙන් වූවනට ශෝකයක් නැත. බියකුත් නැත.''

# තමන් වසන නිවසේ සිටම පෙහෙවස් සමාදන්වීමට බැරිද?



ඇත්තේ. ගිහි පක්ෂයට වුවද පෙහෙවස් සමාදන් වූ දිනයෙහි ආහාර පාන ගැනීමේදී එය නුවණින් සිහිපත් කොට ගැනීම ඉතාමත්ම සුදුසුය. ප්‍රශ්නයෙන් විමසා ඇත්තේ තේ, කෝපි වැනි පාන වර්ග ගැනීමේදී ඇතිවන වින්දනාත්මක සිතිවිලි පහළවීම වළක්වා ගැනීමේ ක්‍රමයක් වශයෙන් ඒවා නොගෙන සිටීම සුදුසුය කියායි. එහෙත් පින්වත, උදේ දානය සහ දහවල් දානය ගැනීමේදී වඩාත් වින්දනාත්මක සිතිවිලි පහළ වේ යැයි මා සිතනවා. එබැවින් වින්දනයන්ගෙන් වෙන්වී පෙහෙවස් විසීමට නම් සුදුසුම ක්‍රමය පෙහෙවස් සමාදන් වූ පසු ආහාරපානාදී කිසිවක් නොගෙන සිටීමයි. එය වඩාත් උචිතයි ඔබගේ අදහසට අනුව.

මෙබඳු දේ පිළිබඳ අප යමක් කීමට ඉක්මන් නොවී මේ පිළිබඳ විමසා බැලීම වඩාත් සුදුසුයි. අපි බලමු භික්ෂු භික්ෂුණී, සාමණේර සාමණේරී ආදීන්ගේ ශීල ශික්ෂාවන් පිළිබඳව ඔවුනට බුදුරදුන් අනුදන වදාරා ඇත්තේ සා පිපාසාදී ගිලන් බවක් ඇතිවූ විට විශේෂයෙන් විකාලයෙහි අෂ්ටපාන ගැනීම සුදුසු බවයි. එමෙන්ම සප්පි, නව නීතාදි වශයෙන් කියවෙන (ගිතෙල්, වෙඬරු, තල තෙල්, මී පැණි, පැණි හෝ සකුරු) පඤ්ච භේසජ්ජයන්ද කැප බව අනුදන වදාරා ඇත. මේ පිළිබඳ අප සාමාන්‍යයෙන් සලකතොත් මේවා සියල්ලම තේ, කෝපි වැනි පෝෂණ ගුණයක් නැති හුදු උණු පානයක්ම නොව ස්වභාවික රසයෙන් හා ගුණයෙන් පිරි අෂ්ටපාන මෙන්ම චතු මධුරද බෙහෙවින්ම පෝෂණ ගුණයෙන් අධික වූ දෑ වෙයි. එහෙත් බුදුරදුන් ගිලන් අවස්ථාවකදී මේවා පරිභෝගයට සුදුසු බව වදාරා ඇති බව බුද්ධදේශිත විනය පිටකයෙහි දක්වා ඇත. බුද්ධ දේශනාවෙන් ඔබ්බට ඔබ ගෙන යන මතය විශේෂයෙන් මසකට වරක් දෙකක් පෙහෙවස් වෙසෙන ගිහි පිරිස තුළ මිත්‍යා මතයක් ඇති කරවැන්නකැයි සිතමි. මෙය මැදුම් පිළිවෙතින් බැහැර වූවක් මෙන්ම බොදුනුවන් අත්ථකිලමතානු යෝගයට හැරවීමට දරන උත්සාහයකි. නූගත් බොදුනුවන්ගේ සිත් තුළ මිත්‍යා මත ඇති කිරීම නුසුදුසුය. කිසිවිටක ශීලයෙන් පමණක් ශුද්ධියක් ලැබිය නොහැකිය. ආහාරපාන ගැනීමේදී සාමාන්‍ය ජනතාව ලබන වින්දනයට වඩා විවිධ වින්දනයන් ඇස, කණ, නාසයෙන් ලැබෙන බව, බලන බව අමතක නොකළ යුතුය. තේ, කෝපිවලින් පමණක් නොව ඇල් දියෙන්ද අන්තවාදීව යන්නාට දෘෂ්ටියක් ඇතිවිය හැකිය. මෙම ක්‍රමය තුළින් විමුක්ති මාර්ගය නොව සීලබ්බත පරාමාසය පරමර්ශනය වීමට ඉඩ ඇතැයි සිතමි.

තේ, කෝපි වැනි පාන වර්ග භික්ෂූන්ට විකාලයේ අකැප විය හැකි යැයි බුරුම රට ඇතැම් විනයධර භික්ෂූන් වහන්සේලා සලකති. එයට ප්‍රධාන හේතුවක් වන්නේ බුරුම ජාතිකයන් අමු තේ දළුවලින් ව්‍යංජන පිළියෙළ කරගැනීම නිසයි. විනය අට්ඨ කතාවට අනුව යම් කොළ වර්ගයක් ආහාර කිස කෙරේ නම් ඒවා විකාලයේ ගිලන් පසට නුසුදුසු යැයි දක්වා තිබීමයි. එහෙත් ගින්නෙන් උණුකර ගන්නා දේවල් සඳහාය එම පැනවීම. ප්‍රශ්නයෙන් දක්වෙන ප්‍රශ්තුතය සඳහා නොවේ. අෂ්ටපාන සියල්ලම ඇල් දියෙන් මිරිකා ගන්නා හෙයින් යථෝක්ත විනය ප්‍රඥප්තිය ඒවාට බල නොපායි.

❐ **පොහොය දිනයෙහි ගමේ විහාරස්ථානයේ පිරිස වැඩි හෙයින් තම නිවසේදීම පෙහෙවස් සමාදන් වී කාලය ගෙවීම නුසුදුසුද?**


ගිහි පින්වතුන්ගේ අවම ශීලය වන පඤ්ච ශීලයට වඩා උතුම් ශීල ප්‍රතිපදාවකි අට සිල්, දස සිල් ආදී පෙහෙවස් ශීලය හෙවත් උපෝෂථ ශීලය. අති බහුතරයක් ගිහි පින්වතුන්ගේ නිවෙස් විහාරස්ථානයක් මෙන් නොව, කාමභෝගීන්ගේ අවශ්‍යතාවන් අනුව පිළියෙළ වූ කාම වස්තුන්ගෙන් පිරුණු ස්ථානයකි. එබඳු ඇතැම් නිවෙස්වල ඇතැම් විටෙක නිහඬතාව පමණක් තිබෙන මුත් දකින, නෙත ගැටෙන හැම මොහොතකම කාම වස්තූන් නිසා කාම නිඃශ්‍රිත සිතිවිලි විරාගී සිතිවිලි පහළ කරගැනීම පහසු නොවේ යැයි සිතමි. මැදහත්ව සිතා බලන්න. තමා පෙහෙවස් සමාදන් වී සිත සන්සුන් කරගැනීම සඳහා අපේක්ෂිත ගුණ නුවණ වැඩීමට බාධාවක් විය නොහැකිද සිය නිවසේ පෙහෙවස් විසීම කියා. විහාරස්ථානයේ පිරිස වැඩිවීම සිල් ගුණ පිරීමට බාධාවක් යැයි නොසිතන්න. සිල් සමාදන් වන පිරිස එක්වී අනුශාසක ස්වාමීන් වහන්සේ සමග සාකච්ඡා කොට පොහොය දිනය අර්ථවත් ලෙස ගෙවන ආකාරය සලසා ගත යුතුය. එය උතුම් සත්පුරුෂ ක්‍රියාවකි. ධර්මය ගැන සාමාන්‍යයෙන් හෝ දන්නා අය තම තමන්ගේ ගෙවල්වලට වී ආත්මාර්ථකාමීව කටයුතු කරගැනීම නිසා බොදු සමාජය පිරිහේ. ගමේ විහාරස්ථානය ගම්වැසියන්ගේ හෙවත් දායක පින්වතුන්ගේ ගුණ නුවණ වර්ධනය කරගැනීම සඳහා සකස් කර ගත් විවේකස්ථානයක් බව අමතක නොකළ යුතුය. යම් හෙයකින් ගමේ විහාරස්ථානයේ භික්ෂූන් වහන්සේ එබඳු කටයුතු සඳහා මන්දෝත්සාහීව වෙසේ නම් උන්වහන්සේ පවා උනන්දු කරවා ගමේ පන්සලේ ශීල ව්‍යාපාරය අර්ථවත්ව ගෙන යාමට ක්‍රියා කිරීම ශාසන මාමක බුද්ධිමත් පින්වතුන්ගේ යුතුකමකි. පන්සලේ සිල් සමාදන්වී කාලය ගත කරන විට වැඩි වශයෙන් නෙත ගැටෙන්නේ විහාරය, බෝධිය, භික්ෂූන් වහන්සේලා, සිල් ගුණ පුරන උවසු උවැසියන් නිසා විරාගී සිතිවිලි පහළ කරන අරමුණුය. එබැවින් තම නිවෙසට වඩා තමන්ටත්, අන්‍යයන්ටත් වැඩි ප්‍රයෝජනයක් පොහෝ දින විහාරස්ථානයේ ගත කිරීමෙන් ලැබේ යැයි සිතමි.

**ධර්ම ගවේෂී**

"ඇත්ත කිව යුතුය. අනුන්ට නොකිපිය යුතුය. අනිකකු යමක් ඉල්ලූ කල ටිකක් වුවත් දිය යුතුය. මේ තුන් කරුණෙන් කෙනෙකුට දෙවියන් වෙත යා හැකිය."

# බොරු කේලම් කීමෙන්

## ලබන ජය තාවකාලිකයි



'එකං ධම්මං අතීතස්ස - මුසාවාදිස්ස ජන්තිනො
විතිණ්ණ පරලොකස්ස - නත්ථි පාපං අකාරියං'

බොරු කියන මිනිසාට නොකළ හැකි පාප කර්මයක් නැත. බොරු කීමෙන්, කේලාම් කීමෙන් ලබන ජය තාවකාලිකය. බොරු කීමෙන්, කේලාම් කීමෙන් වැනසෙන්නේ තමන්මය. යම් රටක බොරුවෙන්, වංචාවෙන් පිරුණු මිනිසුන් සිටී නම් ඒ රටට ඒමට විදේශිකයෝ පවා මැලිවෙති.

ජපන් ජාතිකයන් වැඩි දෙනෙක් බොරු කීම නුරුස්සති. ඔවුන් දියුණු ජාතියක් බවට පත්වී සිටින්නේ බොරු කීමෙන්, කේලාම් කීමෙන් වැඩි දෙනා වැළකී සිටින බැවිනි. බොරුවට වැඩිකල් ආයුෂ නැත. කවදා හෝ සත්‍යය එළිවන අවස්ථාව උදාවේ.



එක් මිනිසෙක් බොරු කීම පුරුද්දක් කොටගෙන සිටියේය. තම පුතා මියගිය බවට බොරු කියා ගමේ යාමට යැයි කියා ඔහු තම මිතුරන්ගෙන් මුදල් ඉල්ලා ගත්තේය. ඔහු ගමට ගොස් නිවසේ අයගේ දුක සැප විමසා නැවත තමන් සේවය කරන ස්ථානයට පැමිණියේය. කාලය සෙමෙන් ගෙවී යන්නට විය. දිනක් ඔහුට හදිසියේම විදුලි පුවතක් ලැබිණි.

එයින් කියැවුණේ ඔහුගේ පුත්‍රයා හදිසි අනතුරකින් මරණයට පත්වී ඇති බවයි. එහෙත් ඔහුගේ මිතුරන් මෙය විශ්වාස නොකළ අතර ඔවුහු පුත්‍රයාගේ මළගමට ඒමද ප්‍රතික්ෂේප කළහ. බොරු කියන පුද්ගලයා ඇත්තක් කීවද කිසිවෙක් එය පිළිගැනීමට කැමැති නැති බව මින් පැහැදිලි වේ.

''ජාතස්සහි පුරිස්ස කුඨාරි ජායතෙ මුඛෙ''
මිනිසා උපදින්නේ කටේ කෙටේරියක් ඇතිවයි. එය තමන්ට මෙන්ම අනුන්දට හානි කරයි. හොඳට, නරකට දෙකට කටමැයි කියමනක්ද තිබේ. තමන්ගේ කට පරිස්සම් කරගතහොත් එය වඩාත් වැඩදායක වේ. බොරු කීමෙන්, කේලාම් කීමෙන් රටක් වැනසිය හැකිය. කටකතාවලට අත්තටු ඇත. එය වේගයෙන් ඉගිලී යයි. පැතිරී යයි.

බොරු කීමෙන් සිය ජීවිකාව සරි කරගන්නා අය කොතෙකුත් අප සමාජයේ සිටිති. සමාජයේ අනුකම්පාව ලබාගැනීමට බොරු කීම ජීවිකා වෘත්තිය කරගත් අය එමට මෙම සමාජයේ වෙති. සමහර වෙළෙඳ ව්‍යාපාරිකයෝ පාරිභෝගිකයා මුලා කොට තම මඩි තර කර ගනිති. තම නිෂ්පාදනවලින් මේ ගුණය ලැබේ යැයි කීවද එම නිෂ්පාදන මිලදී ගන්නා පාරිභෝගිකයාට නොයෙක් දුෂ්කරතාවලට මුහුණ දීමට සිදුවේ. බොරුවෙන්, වංචාවෙන් ගෙවන ජීවිතය අගයක් නැත. පිරිසිදු සිතින්, මෙත් සිතින්, අවංක සිතින් ගෙවන එක මොහොතක් වුවද රන් හා වටී.

**තිලක් පුෂ්පකුමාර සේනානායක**

''යකඩයෙන් නැගුණ මලකඩ එම යකඩයම කා දමයි. නුවණින් තොරව වසන තැනැත්තාගේ අකුසල් ඔහු දුගතියට යවයි.''

දළදා වරුණ
ශ්‍රී දළදා මාළිගාව මාසිකව නිකුත් කරන බෞද්ධ සඟරාව

මාධ්‍ය විශේෂ ව්‍යාපෘති කාර්යාංශය
ශ්‍රී දළදා මාළිගය
මහනුවර
දුරකථන : 0812204684
ෆැක්ස් : 0812236202
E mail : media@sridaladamaligawa.lk
Web : www.sridalada maligawa.lk

# නව වසරේ අපේ පැතුම

අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේ විසින් අප වෙත දයාද කරන ලද ථෙරවාදී බුදු දහමේ මූලික හර පද්ධතිය පදනම් කොට ගොඩනැගුණු බෞද්ධ සංස්කෘතියක් හිමි ශ්‍රී ලාංකීය සමාජය අද කිසියම් සමාජ, දේශපාලන අර්බුදයකට මුහුණ පා සිටින අයුරක් දිස්වේ. ජාතික, ආගමික, සංහිඳියාව වෙනුවෙන් රටේ සමගිය හා සාධාරණත්වය ඉටු කරලීම රට පාලනය කරන ඇත්තන්ගේ පරම යුතුකම හා වගකීම බව මෙහිදී කිව යුතුමය. ඒ සඳහා පක්ෂ, පාට, ජාති, කුල, ආගම් යන කිසිදු සාධකයක් වලංගු කරගත යුතු නැත. එහෙත් බෞද්ධ රාජ්‍යයක් වූ ශ්‍රී ලංකාව හැම අවස්ථාවකදීම බෞද්ධකම සුරකින ධාර්මිෂ්ඨ සමාජයක් බිහි කරලීමට බලය ලබාගත් පාලකයන් ජනතාව ඉදිරියේ පොරොන්දු වුවත් එය ඉටු කරලීමේදී කිසියම් මන්දගාමී ස්වරූපයක් පෙන්නුම් කළ බව අපගේ හැඟීමය.

බෞද්ධ දර්ශනය අනුව රටක සංවර්ධනය මනින ප්‍රධාන ඒකකය වන්නේ එරටේ ජනතාවගේ සතුට හා ජීවන තෘප්තිය බව ඉතා පැහැදිලිය. එහෙත් අද රටේ බහුතර ජනතාව දිවි ගෙවන්නේ සතුටින් හා සහජීවනයෙන්ද යන වග ගැටලු සහිතය. මෙබඳු අතෘප්තිමත් තත්ත්වයක් නිර්මාණය වීමට බලපෑ ප්‍රධාන හේතූන් මොනවාද යන්න 2017 නව වසර උදාවූ මේ දුරුතු මහේදී සිහි නුවණින් යුතුව කල්පනා කර බැලීම වටී. අද රට පාලනය වන්නේ බුදුන් වහන්සේ දේශනා කළ ධර්මය හා එම පුළුල් දර්ශනය පදනම් කරගෙනද යන්න ගැන අද මහා සංසරත්නය මෙන්ම රටේ විද්වතුන්ද තම කතිකාවට භාජනය කළ යුතු වැදගත් මාතෘකාවක්ය යන්න අපගේ අදහසයි.


රට පාලනය කරන උදවිය ජනතාවට වගකිව යුතු බැවින් සෑම වැදගත් තීන්දුවක්ම ගත යුත්තේ ජනතා කැමැත්ත හා ඔවුන්ගේ ආශිර්වාදය ඇතිවය. එසේ නොවුණු කල රටේ අසමගිය හා ආරවුල් ඇතිවී රටේ අරාජික තත්ත්වයක් ඇතිවීමට ඉඩ අවකාශය විවර වේ. සැබැවින්ම අප රට අද ගමන් කළ යුත්තේ ධර්ම රාජ්‍යයක් වෙතටය. එය මනුෂ්‍ය වර්ගයාට පමණක් නොව සතා සිව්පාවන්ට, ගහ කොළ ඇතුළු සමස්ත පරිසරයටම එකසේ දයාව හා මෙත් කරුණාව පළ කරන ධාර්මිෂ්ඨ සමාජයක්ම විය යුතුය. ඒ උදාරතර කාල පරිච්ඡේදය ඉක්මනින්ම පහළ වේවා යැයි උදාවූ නව වසරේ අපි මෙත් සිතින් ප්‍රාර්ථනා කරමු. ■

බුදුරජාණන් වහන්සේගේ පිවිතුරු පාද ස්පර්ශය ලත් කැලණි රජමහ විහාර පූද බිම බෞද්ධ ජනයාගේ ගරු බුහුමනට ලක්ව තිබෙන අතිපූජනීය පුණ්‍ය භූමියකි. බුදුපියාණන්ට අමතරව මහ රහතන් වහන්සේලාගේ වැඩම කිරීමෙන්ද මෙම පින් බිම අති පාරිශුද්ධත්වයට පත්ව තිබේ. ලංකාවත්, සම්බුධ ශාසනයත් සුරකින ශ්‍රී විෂ්ණු දෙවියන් මෙන්ම මණිඅක්ඛිත නා රජුන් වැඩ වෙසෙන බවට විශ්වාස කෙරෙන කැලණි විහාර පින් බිම සෑම දුරුතු පොහොයකදීම බෞද්ධ සැදැහැවතුන්ගෙන් පිරී ඉතිරී යති.


දැනට කැලණි විහාර භූමියේ ස්ථාපිත කොට ඇති ධාතු මන්දිරයේ බුදුන්ගේ සර්වඥ ධාතූන් හා කේශ ධාතූන්ද, මහ රහතන් වහන්සේලාගේ ධාතූන්ද තැන්පත් කොට තිබේ. එකල කැලණියේ පාලකයා වූයේ මණිඅක්ඛිත නා රජු බව ඉතිහාස මූලාශ්‍රවල සඳහන් වේ. එදා නාගදීපයේදී මැණික් පුටුවක් ලබාගැනීම සඳහා චූලෝදර මහෝදර නා රජවරු දෙදෙනා අතර යුද්ධයක් හටගෙන ඇත. එහිදී

මහෝදර
කැලණියේ
මෙම යුද
ලංකාවට
බව බෞද්
ගැටුම සං
වැඩම කර
කොට තිබ
බුදු පදවිය
වහන්සේ
වෙසක් පො
මහරහතන්
දිය නැමෙ
නා රජුට
දේශනයක්
කරන පූජ
ඇත්තේ එ
ලද පූජනීය
බුදුපියාණ

# සම්බුදු පා
# කැලණිය



ජුට උදව් කරන්නට ගොස් ඇත්තේ
ළකයා වූ මණිඅක්ඛිත නා රජුය.
ම සංසිඳවන්නට එදා බුදුන් වහන්සේ
 කොට මහා ප්‍රාතිහාර්යයක් පෑ
තිහාස මූලාශ්‍රවල සඳහන් වේ. එම
 බුදුරජාණන් වහන්සේට කැලණියට
ලසට මණිඅක්ඛිත රජු ඉල්ලීමක්
හෙත් බුදුන් ලංකාවට වැඩම කළේ
 අටවන වර්ෂයේදීය. බුදුපියාණන්
වට නැවත වැඩම කරවන්නේ
ග් දිනයක තවත් පන්සියයක
න්සේලාද කැටුවය. කැලණි නදියෙන්
නතුරුව බුදුපියාණන් මණිඅක්ඛිත
හුගේ පිරිවර සේනාවන්ට ධර්ම
ැත්වූ සේක. අද අප වැඳුම් පිදුම්
කැලණි විහාර දාගැබ ඉදිකොට
දුන් ධර්ම දේශනාව පවත්වන
ානයේදී බව සඳහන් වේ. එදා
ඩ හිඳි මැණික් පුටුව මෙම දාගැබ



# ...ස ලද
# ...පුද බිම

තුළ නිධන් කොට ඇත. එම දාගැබ අපගේ විශේෂ ගෞරවාදරයට පාත්‍ර වන්නේ එබැවිනි. කැලණි චෛත්‍යය ධාන්‍යාගාර හැඩ තලයකින් යුක්තව ඉදිකොට තිබේ. එහි උස අඩි 80 ක් වන අතර දාගැබේ වට ප්‍රමාණය අඩි 180 කි.

"උපන් දා සිට කරපු පව් නැත වරක් වැන්දොත් කැලණියේ" යන ප්‍රකට කියමන ඔබ අසා ඇතිවාට සැක නැත. එහෙත් මේ ප්‍රකාශය කා විසින් කරන ලද්දක්ද යන්න අප බොහෝ දෙනෙක් දන්නේ නැත. එදා මහනුවර යුගයේ සිටි 'ලෝකුරු නයිදේ' නමැති කවියා විසින් ලියන ලද 'කැලණි හැල්ල' නම් කාව්‍ය ග්‍රන්ථයේ මේ අපූරු කියමන සඳහන්ව තිබේ.


පසු කාලයකදී කැලණි රජමහ විහාරය වැඩි දියුණු කිරීමට මූලිකව කටයුතු කළේ 'උත්තිය' රජතුමා විසිනි. ඒ ක්‍රි. පූර්ව 207 වසරේදීය. කැලණි විහාරයට නව ප්‍රබෝධයක් ලබාදීමට උත්තිය රජතුමා විශාල මෙහෙවරක් ඉටුකොට තිබේ.

කැලණි විහාරයේ යටගියාව දෙසට හැරී බලද්දී කැලණි රජමහ පෙරහර ගැනද කරුණු කාරණා මතකයට එයි. එයටද දිගු ඉතිහාසයක් ඇත. එදා විහාරාධිපති ධුරය ඉසිලූ පූජ්‍ය මාපිටිගම ධම්මරක්ඛිත ස්වාමීන් වහන්සේ විසින් මුල්ම වරට ඓතිහාසික කැලණි රජමහ පෙරහර ආරම්භ කරන්නේ 1925 දුරුතු පසළොස්වක පොහෝ දිනකය. ඉපැරණි රජ දවස හෙළ සිරිත් විරිත් හා පෞරාණික සංස්කෘතික අංගයන්ගෙන් සමන්විත අලි ඇතුන් සහිත කැලණි රජමහ පෙරහර අදටත් අඛණ්ඩව පවත්වාගෙන යනු ලබන්නේ අප සිතු තුළ බුද්ධාලම්භන ප්‍රීතිය දනවමිනි. මෙවර පෙරහර මංගල්‍යයේ අවසාන මහ පෙරහර වීදි සැරීමට නියමිතව තිබුණේ ජනවාරි මස 11 වැනිදාටය.

කැලණි දුරුතු මහ මංගල්‍ය පෙරහර දෙවැනි වන්නේ කන්ද උඩරට ශ්‍රී දළදා පෙරහට පමණි. කැලණි පෙරහර එකල හඳුන්වා ඇත්තේ 'ධාතු පෙරහර' යන නමිනි. එය සධාතුක කරඬුව, නැටුම්, අලි ඇතුන් හා වෙනත් සංස්කෘතික අංගයන් සහිත පෙරහරක් වූ බව ඉතිහාස පොත්වල සඳහන් වේ. මුල්ම කැලණි පෙරහරින් පසුව ඊට පසුකාලීනව තවත් සුවිශේෂී අංගයක්ද ඇතුළත්ව තිබේ. මෙහි විභීෂණ, නාථ, විෂ්ණු හා කතරගම ආදී දේවල පෙරහරවලට එක්වූ නර්තන අංගයන්ට කාන්තාවන්ද දායක කරගෙන තිබීම විශේෂත්වයක් විය. එහෙත් කැලණි විහාරස්ථ පෙරහරට කාන්තා නැටුම් ඇතුළත් කර නොගැනීමද විශේෂයෙන්ම සඳහන් කළ යුතුය.

සිරිපා සමය දැන් ආරම්භ වී තිබුණද කොළඹ, ගම්පහ, කළුතර ආදී දිස්ත්‍රික්කවලින් දුරුතු පොහොයට කැලණි පුද බිම කරා ඇදෙන ජනතාව අති විශාලය. පොහෝ දිනට නිදහසේ මලක් පූජා කරන්නට බැරි තරම් සැදැහැවතුන්ගෙන් පුද බිම පිරී ඉතිරෙයි. වර්තමානයෙහි කැලණි රජමහ විහාරයේ විහාරාධිපති ස්වාමීන් වහන්සේ ලෙසට විශාල කාර්යභාරයක් ඉටුකරනු ලබන්නේ මහාචාර්ය කොල්ලුපිටියේ මහින්ද නායක හිමිපාණෝය. උන්වහන්සේගේ දිරිය, ශක්තිය හා කැපවීම මත කැලණි පුද බිම වන්දනාමාන කරන්නට දස දිගින් මෙහි ඇදෙන සැදැහැවතුන් බොහෝය. අද වන විට බුදු පහස ලද විරාජමාන කැලණි පුද බිම ලෝකයේ ඇති ප්‍රකට පූජ්‍යස්ථානවලින් එකකි.

**නිව්ටන් ගුණසේකර**



සීතහිමේ හාස්කම්

# ශ්‍රී පාදයේදී තෙවරක් දුටු අද්භූත අමුත්තා

වේලාව සවස හතට ආසන්නය. ඒ මස්කෙළිය, සමන්එළිය මහා විද්‍යාලයේ ගුරු නිවස අසල ක්‍රි.ව. 1978 සිදුවූ සිදුවීමකි. මස්කෙළිය ආරච්චි වසම හා ඉන්පසුව ග්‍රාමසේවක ලෙස කටයුතු කළ රොබට් මහතා මා සමග මිදුලේ කතා කරමින් සිටියේය. ඔහු මස්කෙළිය නව නගරය ඉදිවීමට පෙර තිබුණු ගඟේවත්ත පැරණි විහාර තිබූ අවදියේ පටන් ආරච්චි වසම කර මේ අඩවිය ගැන හොඳ දැනුමක් ඇති අයෙකි.

නල්ලතන්නිය සිට ශ්‍රී පාද පද්මය දක්වා මගදිගට ශ්‍රීපාද පාර දිගේ දැල්වුණු විදුලි බුබුළු පෙළ වැටී එන අන්ධකාරය



"නීතිගරුකව කටයුතු කිරීම හැම අතින්ම හිතකරය - ගග්ග ජාතකය"





මැදින් සිත් මෝහනය කරමින් දූල්වෙයි. අහසේ අඳුර උරාගෙන මැදින් මස මෝර්න පසළොස්වක හඳ පළුව උදාවෙයි. ශ්‍රී පාද පද්මය මුදුනේ සිට මෝරන හඳ පළුවේ රැසි දිග අතට හරස් අතට කොටු බෙදුවා මෙන් එක මොහොතින් අහස වසාගෙන පැතිරෙයි. භක්තිය උතුරා යන සිතින් මම, බිරිඳ හා දියණියටද කතා කර අහසේ අද්භූත විසිතුරු රටාව පෙන්වූයෙමි. සමන්එළිය මහා විද්‍යාලයේ විදුහල්පති ලෙස සේවයට පැමිණ අවුරුදු හතරක් ගෙවී ගිය බව සිහිනයක් මෙන් මට දැනිණ. නිශ්ශබ්දතාව බින්දේ ආරච්චි මහතාය.

''මහත්තයා, සමන් දෙවියන්ගේ අඩවියේ මොනතරම් හාස්කම් තියෙනවද? මම නල්ලත්තියේ ඉඳලා පද්මයට යනකල් අවුරුදු තිහක් විතර වසම වැඩම කළා. ඉසේ කෙස් ගාණට හාස්කම් දැක්කා. ඒ කාලේ දැන් වගේ ලයිට් නෑ. රේල්ලුව ආවේ හැටන්වලට විතරයි. නඩේගුරා යටතේ වන්දනා නඩ මහ රෑ හුළු අතු බැඳගෙන හැටන් ටවුමේ ඉඳන් නල්ලතන්නියට යන්නේ තුන් සරණේ කිය කියා පයින්. බස්, ලොරි ආවේ පස්සේ. ඒ කාලේ මස්කෙළිය පරණ ටවුම, ඒකට කිව්වේ ගඟේවත්ත කියලා. මස්කෙළිය ජලාශේ බඳින කොට ගඟේවත්ත යටවුණා. ජලාශේ වතුර අඩුවෙලා ඉඩෝර කාලේ ආවම ගඟේවත්ත යටවුණු පරණ ටවුමේ පන්සල, කෝවිල, ගොඩනැගිලි මතුවෙනවා. ගඟේවත්ත ටවුම පොඩියි. වන්දනා කාලෙට එකම සෙනඟ කන්දරාව. රෑ එළිවෙනකල් සෙනඟ පිරිලා යනවා එනවා. පයින් හැටන්වල ඉඳන් එන නඩ ගිමල් ඇරලා, තේ බීලා නල්ලතන්නියට යනවා. ඔය කාලේ පාර කැපිලා ගඟේවත්තට වාහන දුවන්න වුණා. කොතලාවල මහත්තයා ලක්ෂපානේ ඇරඹුවා. විදුලි වැඩට උමගේ කැපුවා. උමගේ කඩා වැටෙනවා. වතාවක් වැඩකරන මිනිස්සුත් එක්කම කඩා වැටුණා. ඒ වෙලාවේ එතුමා සමන් දෙයියන්ට බාරයක් වුණා. ලක්ෂපාන ජල විදුලිය නිපදවන ගමන් ඉස්ඉස්සෙල්ලාම ශ්‍රීපාද පද්මය, ශ්‍රීපාද මාර්ගයට ආලෝකය දෙනවා කියලා. ඊට පස්සේ වැඩ හරිගියා. උමග කැපුවා 1950. ඒ අනුව මුලින්ම ශ්‍රීපාද පද්මෙට, ශ්‍රීපාද පාරට විදුලි එළිය දුන්නා. විදුලි එළිය දෙනකල් මිනිස්සු ශ්‍රීපාදේ නැග්ගේ පන්දම් දල්වාගෙන. නැත්නම් විදුලි පන්දම් අරගෙන. ඒ කාලේ හැටන්, ගඟේවත්ත, නල්ලතන්නි කඩවල සකස් කරපු පන්දම් විකිණුවා. නැත්නම් ගමේදීම ඒ නඩ හදාගෙන එනවා.''


''ආරච්චි මහත්තයා, ඒ කාලේ ශ්‍රීපාදේ පාරවල් අතරමග තැන් ගැන හොඳට දැනුම ඇතිව ඉන්න ඇති?''

''මොනවද මහත්තයා, සමන් දෙයි හාමුදුරු අඩවියේ හැම ගහක් කොළක් ගාණෙම මම ඇවිද්දා. අවාරේ ශ්‍රීපාදේ යනවා කියන්නේ එදා මරණේ ලියාගන්න එක. මහරගම ඉන්න රෝගියෙක් එකසිය දහ වතාවක් ශ්‍රීපාදේ ගියා. මම දැක්කා යන අය ගියේ භක්තියෙන්, දයාවෙන්, විනීතව. කාලේ වෙනස් වෙලා තියෙන්නේ දැන්.''

''ආරච්චි මහත්තයා, දවසක් සිල් මාතාවක් ගැන කතාවක් කිව්වා මට යන්තමින් මතකයි?''

''ඔව් ඔව්, මම කියන්නම්. ඒ කාලේ අවාරේ. දිවියා, අලි රංචු අනන්තයි. අලි රංචු පද්මේ මුදුනටම යනවා. අලියා කඩා දාපු අතු මගදිගට නල්ලතන්නි ටවුමටත් අවාරේ දිවියෝ එනවා. එතකොට මුළු කඩමණ්ඩියම අවාරෙට නල්ලතන්නිය වහනවා සමපූකාර කඩේ ඇරුණම.''

''දැන් මහත්තයා අහපු කතාව කියන්නම්. ගිනිගත්හේන පැත්තේ ඒ කාලේ උපාසිකා ආරාමයක් තිබුණා. ඒකේ ලොකු මාතාව බොහොම සිල්වත්. දානමාන පින්කම්වලට බොහොම ලැදියි. නිතර භාවනාවට හිත යොදනවා. සමන් දෙයියන් ගැන විශ්වාසයි. වන්දනා කාලේ ඒ සිල් මාතාව පිරිවර මෑණිවරුත් එක්ක කළමනා



බැඳගෙන වන්දනාවේ යනවා. දවසක් මේ සිල් මාතාව පිරිවර තුන්. හතර දෙනෙක් එක්ක ශ්‍රීපාදේ නගින්න යනවා. සීතගඟුලේ ලස්සනට වතුර ගලනවා. පිරිවර සීත ගඟුලට බැහැලා නා පිරිසිදු වුණා. පන්සිල් අරගෙන කෝපි බීලා, විට හපලා ගමන ඇරඹුවා. මැණියෝ ඉස්සරහින් වයසක රැවුල වැවුණු, කකුල නොන්ඩි ගහන, විශාල තුවාලයක් කකුලේ හැදුණු මහල්ලෙක් හැරමිටි ගහගෙන තනියම ශ්‍රීපාදේ නගිනවා. මැණියන්ගේ හිත උණු වුණා. මේ මනුස්සයා කොහොම යන්නද? දවස් දහයක් ගියත් පද්මෙට යන්න බැරිවෙයි. භක්තිය, ශ්‍රද්ධාව, හිතේ හයිය හින්දා ශ්‍රීපාදේ නගිනවා වෙන්න ඇති කියලා හිතුණා. ළඟින් යනකොට හැරමිටිය ඇණ තියාගෙන මහල්ලා මැණියන්ගේ මුඩු හිස අතගෑවා. මැණියන්ට ලොකු පිළිකුලක් ඇති වුණා. ජූතකයා වාගේ තුවාල බැඳගෙන, යන්න එන්න බැරුව ඉන්දැද්දී අතරමග හිටගෙන ඔළුවත් අතගෑවා කියලා ටිකක් තරහා ගියා. මහල්ලා පහු කරගෙන හැතැප්මක් විතර මැණියෝ පිරිවරත් එක්ක විට හපන්න ටිකක් විවේක ගත්තා. විනාඩි පහළොවක් විතර නතර වෙලා ආයෙත් ගමන පටන් ගත්තා. සෙනඟ වැඩියි. නඩ ළඟ ළඟම ගමන් කරනවා. මැණියෝ ඉස්සරහින් ආයෙමත් අර මහල්ලා ලොකු තුවාලයක් බැඳගෙන, රැවුල වවාගෙන, ජටාව බැඳගෙන, හැරමිටිය අතේ අරගෙන පද්මේ නගිනවා.''

''මැණියන්ට හිතේ පුදුමයක් ඇති වුණා. හිත ගැස්සුණා. සීතගඟුල ළඟදී පහුවුණු මහල්ලා දැන් ඒ අයට ඉස්සරින් නගිනවා. ඉගිල්ලිලා ආවද කියලා හිතුණා. අඩිය තියන්නත් බෑ. ආයෙත් මහල්ල් හැරමිටිය අරගෙන පාරේ ඉඩ දීලා අයින් වුණා. පඩි පෙළ නගිද්දී මැණියන්ගේ මුඩු හිසට අත තිබ්බා. උපාසිකා මාතාවට පිළිකුල, කෝපය නැවතත් මතුවුණා. ඒ යට කරගෙන සිල්මාතාව පද්මේ නගින්න වුණා. මහළු මනුස්සයා වැටට හේත්තු වෙලා ඉන්නවා.''

''දැන් පද්මෙට ළඟයි. සෙනඟ පිරිලා. නඩ ළඟ ළඟ කන්ද නගිනවා. පද්මේ එළියක් පේනවා. තුන්වැනි සැරේට මහල්ලා ආයෙත් සිල් මාතාව ඉස්සරහා ඉන්නවා. පිරිස ගල් ගැහුණා. මේ මනුස්සයට කන්ද නගිනවා තියා කකුල උස්සන්නත් බෑ තුවාලේ බැඳගෙන. මේක මහා පුදුමයක්. සිල් මැණියෝ ආයෙත් ඉස්සර වුණා. මහළු මනුස්සයා අයිනට වුණා. මැණියන්ගේ මුඩු හිස ආයෙත් අත ගෑවා. සිල් මාතාවට පිළිකුලක් වගේම මහා ලොකු පුදුමයක් ඇතිවුණා. පද්මෙට නැග්ගා. පාන්දර පහට විතර පිරිවරත් එක්ක මැණියෝ පද්මේ භාවනාව. ඉර සේවය එනකල් මැණියෝ පද්මේ මුදුනේ භාවනාව. මහා ලොකු ආලෝකයක් සිල් මැණියන්ගේ මුහුණට ගලා ආවා. 'දරුවා, මම උඹට තුන් වතාවක් කතා කළා. උඹට මම පිළිකුල් වුණා නේද?' හඬ අතුරුදන් වුණා. මැණියන්ගේ හිත කීරි ගැහිලා ගියා. අසීමිත භක්තියෙන් සිල් මාතාව පද්මේ නමස්කාර කළා. මට කීප වතාවක් ඒ සිල් මාතාව නල්ලතන්නියේදී හමුවෙලා තියෙනවා. සිල් මැණියෝම තමයි මට මේ කතාව කිව්වේ.''

ආරච්චි මහතා කතාව මඳකට නවතා සමනොළ කඳු මුදුන දෙස බලා සිටියේය. පුන් සඳ අහස මුදුනටම විත් බැබළෙමින් තිබුණේය. මටත් නොදැනීම මගේ සිත ''සාදු... සාදු...'' යැයි කීවේය.

**එස්. කේ. ජයවර්ධන**

''උත්සාහවන්තයා සියල්ල ජයගනී - වණ්ණුපථ ජාතකය''

සිල්වතුන්, ගුණවතුන් සොයාගෙන දෙවියන් එන හැටි පුදුමයි

# මහා කස්සප

## තෙරුන් වහන්සේගේ කතා පුවත

අපේ බුදුරජාණන් වහන්සේගේ ශාසනයේ මහා පුණ්‍යවන්ත උත්තමයන් පැවිදි වෙලා සිටියා. ඒ තමයි මහා කස්සප මහ රහතන් වහන්සේ. උන්වහන්සේ සියලු තපස් ගුණයන්ගෙන් අග්‍රවූ උත්තමයෙක්. වැඩි කාලයක් වාසය කළේ මහා වනාන්තරයේමයි. උන්වහන්සේට දෙවිවරු ඉතාමත් ආදරෙයි.

ඇතැම් දිනවලදී උන්වහන්සේ කුටියෙන් එළියට වඩින විට කුටිය අවට ලස්සනට ඇමදලා තියෙනවා. භාජනවල පැන් පෙරා තියෙනවා. හැමතැනම ලස්සනට මල් අතුරලා තියෙනවා. ඒවා කරපු කෙනෙක් නෑ. ඒ සියල්ල කරන්නේ උන්වහන්සේට මහත් සේ ආදර ගෞරව දක්වන දෙවිවරුන් විසිනුයි.

එක දවසක් මහා කස්සප මහ රහතන් වහන්සේ නිරෝධ සමාපත්තියට සමවැදුණා. දරුවනේ, නිරෝධ සමාපත්තිය කියන්නේ හරිම ආශ්චර්යවත් සමාධි බලයක්. ඒ සමාධියට කෙනෙක් සමවැදුණ විට ඉතාම පහසුවෙන්, එකම ඉරියව්වෙන් සතියක් ගත කරන්න පුළුවන්. ඉතින් මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ ඒ නිරෝධ සමාපත්තිය තුළ සතියක් ගත කළා. ඒ සතිය ඇවෑමෙන් සමාධියෙන් නැගිට්ටා. රජගහ නුවර පිඬුසිඟා වඩින්නට පිටත් වුණා.



එවේලෙහි සක්දෙව් රජතුමාගේ පිරිවර වූ පන්සියයක් දිව්‍ය අප්සරාවන් මෙහෙම කතාබස් කරගත්තා. ''පින්වත් අප්සරාවියනි, එන්න යන්න. අපගේ පරම පූජනීය ආර්යයන් වහන්සේ වන මහා කස්සප මහ රහතන් වහන්සේ අන්න දින හතක් සමාධියෙන් වැඩ සිට රජගහ නුවර පිණ්ඩපාතයේ වඩිනවා. අපි උන්වහන්සේට දානයක් පූජා කරමු.'' සියලු දිව්‍ය අප්සරාවියන් හරි සතුටු වුණා. ඉතින් ඒ සියලු දෙනා ඉතාම ප්‍රණීත ආහාරපාන ඍද්ධි බලයෙන් මවාගෙන මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ වඩින මාවතේ පහළ වුණා. ''ස්වාමීනි, මේ පිණ්ඩපාතය පිළිගන්නා සේක්වා. අපටද අනුග්‍රහ කරන සේක්වා.''

මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ මෙහෙම වදාළා.

''පින්වත් දෙව්වරුනි, ඔබට පින් තියෙනවා. පින නිසයි ඔබ දෙවියන් අතර ඔය සැප විඳින්නේ. ඒ නිසා ඔබ මෙතනින් යන්න. මම මේ සූදානම් වන්නේ ඉතාම දිළිඳු මිනිසුන්ට පින් කරගන්නට අවස්ථාවක් ලබාදෙන්නටයි.''

''අනේ ස්වාමීනි, එහෙම කියන්නට එපා. අපටත් අනුකම්පාවෙන් උපකාර කළ මැනැව.''

එසේ කියමින් මහා කාශ්‍යප මහ රහතන් වහන්සේට කරදර කරන්නට පටන් ගත්තා. එවිට මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ එම දිව්‍ය අප්සරාවියන්ට මෙහෙම කිව්වා.

''එම්බා අප්සරාවියනි,

"අනුවණකම නිසා නොදැන ක්‍රියා කරන්නෝ විනාශය කරා ළඟාවෙති - අපණ්ණක ජාතකය"

ඇයි මගේ වචනය අහන්නේ නැත්තේ? තමන්ගේ ප්‍රමාණය දන්නේ නැද්ද? යනවා යන්න මෙතනින්.''

එතකොට ඒ අප්සරාවියන්ට තෙරුන් වහන්සේ ඉදිරියේ සිටින්නට බැරිව ඉතා දුකින් අතුරුදන් වුණා. දෙව්ලොවටම ගියා. ශක්‍ර දෙවියන්ට මේ කරුණ සැල කළා. ශක්‍ර දෙවියන් එම අප්සරාවියන්ගෙන් විමසුවා ''අප්සරාවියනේ, මහා කස්සප මහ රහතන් වහන්සේ ඉතාමත් කරුණාවන්තයි, උන්වහන්සේගේ සිතේ තියෙන්නේ ඉතා දුගී දුප්පත් මනුෂ්‍යයන් හට දුර්ලභ පිනක් අත්පත් කර දෙන්නයි. ඒකයි උන්වහන්සේ එහෙම කළේ. ඉතින් ඔබ උන්වහන්සේ ඉදිරියේ පෙනී සිටියේ කොහොමද?''

''දේවේන්ද්‍රය, අපි දිව්‍ය වස්ත්‍රාභරණයෙන් සැරසිලයි උන්වහන්සේ ඉදිරියේ පෙනී සිටියේ.''

ශක්‍ර දෙවියන් සිනහා වුණා.

''අනේ අනේ, මහ කස්සප මහ රහතන් වහන්සේට නුඹලා කොහොම නම් දන් දෙන්නද? හැබැයි අප්සරාවියනි, මමත් ආසයි උන්වහන්සේට දානේ ටිකක් පූජා කරගන්නට.''

ඊට පස්සේ ශක්‍ර දෙවියන් ඉතාමත්ම දුර්වල, ජරාජීර්ණ වූ මහල්ලෙකුගේ වේශයකින් රජගහ නුවර රෙදි වියන මිනිසුන් සිටින වීදියේ කොණක පහළ වුණා. එතන පුංචි පැල්පතක් මැවුණා. ශක්‍ර දෙවියන්ග් බිසව වන සුජම්පතී දිව්‍යාංගනාව ඉතා දුගී මැහැල්ලියකගේ වේශයෙන් එතන පහළ වුණා. දූන් අර මහල්ලා නූල් කටිනවා. මැහැල්ලී බොහෝම අමාරුවෙන් හැළි වළං පිරිසිදු කරනවා.

මහා කස්සප මහ රහතන් වහන්සේ ඒ රෙදි වියන මිනිසුන්ගේ වීදිය දෙස බලද්දී ඉතා අසරණව සිටින මේ ජෝඩුව දැක්කා. දැකලා මෙහෙම කල්පනා කළා. 'අනේ මෙතරම් වයසට ගිහිනුත් මේ තැනැත්තා වැඩ කරනවා. මේ වයසක උපාසිකාවත් වෙහෙස මහන්සි වෙනවා. මේ ඇත්තන්ට පින් පිණිස මේ පැල්පතට පිඬු සිඟා පැමිණිය යුතුයි. මේ ඇත්තන්ටමයි උපකාර කළ යුත්තේ. මේ වෙලාවේ කුඩු රොටියක් පූජා කළත් මේ ඇත්තන්ට පින් ලැබෙනවා.'

මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ පැල්පත ඉදිරියට වැඩම කළා. අර මහල්ලා අමාරුවෙන් කෙඳිරි ගගා මෙහෙම කියනවා.

''හාමිනේ, මෙහෙට එන්න. අපගේ ආර්යයන් වහන්සේ නමක් වැඩම කරලා සිටිනවා. අපි පිණ්ඩපාතේ දානේ ටිකක් පූජා කරගනිමු'' කියලා මහල්ලා තෙරුන් වහන්සේට වන්දනා කළා. අමාරුවෙන් වගේ ඇස් දෙක පොඩි කර නළලට අත තබා තෙරුන්ගේ මුහුණ දෙස බැලුවා.

''හප්පේ.... අපගේ මේ මහා කස්සප තෙරුන් වහන්සේ නොවැ. අනේ... වාසනාවන්! අපගේ මේ දුගී පැලටත් වැඩියා නොවැ. හාමිනේ පූජා කරගන්න මොනවා හරි ගෙදර තියෙනවාද?''

''ස්වාමීනි තියෙනවා.''

''අනේ පින්වත් ආර්යයන් වහන්ස, රස නීරස නොබලා අප කෙරෙහි අනුකම්පාවෙන් අපට අනුග්‍රහ කරන සේක්වා!'' කියමින් දෝතින්ම පාත්‍රය ලබාගැනීම පිණිස දෑත දිගු කළා. මහා කස්සප මහ රහතන් වහන්සේ ''අනේ මේ ඇත්තන්ට පිහිටක් වෙන්න ඕනම'' කියා සිතමින් පාත්‍රය දුන්නා. ඒ මහල්ලා පැල්පත ඇතුළට ගොස් අනේක රස මසවුළු පිරි ප්‍රණීත භෝජනයක් පුරවා පාත්‍රය රැගෙන එනවිට රජගහ නුවර හාත්පස සිසාරා මිහිරි සුවඳක් පැතිරී ගියා.

මහා කස්සප මහ රහතන් වහන්සේට මෙහෙම සිතුණා. ''ම්... මේ කෙනා බොහොම දුගී කෙනෙක් නෙව. ඒ වුණාට පිණ්ඩපාතෙ දනෙ නම් මහේශාක්‍යයි. ශක්‍ර දෙවියන්ගේ භෝජනය වගෙයි. එතකොට මෙයා කවුද?'' සැණෙකින්ම මොහු ශක්‍ර දෙවියන් බව තෙරුන් වහන්සේ හඳුනා ගත්තා.

''පින්වත් දෙව්ඳ, කරපු වැඩේ නම් හරි නෑ. අසරණ දුගී කෙනෙකුට ලබන්න තියෙන සම්පත්තිය නේද ඔය පැහැර ගත්තේ? අද යම්කිසි දුගී දුප්පතෙක් මේ දනය පූජා කරගත්තා නම් ඔහුට සිටු තනතුර ලැබෙනවා.''

''අනේ ස්වාමීනී, මමත් දුගී කෙනෙක් තමයි.''

''පින්වත් දෙව්ඳ, ඔබ දුගියෙක් වෙන්නෙ කොහොමද? දෙව්ලොව රාජශ්‍රීයෙන් අනුභව කරන කෙනෙක් නෙව.''

''අනේ ස්වාමීනී, මම අබුද්ධෝත්පාද කාලයක කරපු පින්වලිනුයි මේ දිව්‍ය සම්පත් ලැබුවේ. ඒ වුණාට මේ බුද්ධෝත්පාද කාලයේදී පින් කරපු බොහෝ දෙනෙක් දෙව් ලොව ඉපදිලා සිටිනවා. ඔවුන් මට වඩා තේජවන්තයි. ඔවුන්ගේ පුණ්‍ය වාසනාව හරම බලවත්. ඒ නිසා මමත් දුගියෙක් නේද?''

''පින්වත් දෙව්ඳ, ඒ වුණාට මීට පස්සේ නම් මෙවැනි වංචා කොට දන් දෙන්න එපා.''

''අනේ ස්වාමීනී, එහෙම නම් මේ ප්‍රශ්නයට මට උත්තරයක් දෙන්න. වංචාවෙන් හරි මං ඔබවහන්සේට දනෙ ටිකක් පූජා කරගත්තා. මේකෙන් මට පිනක් තියෙනවාද? නැද්ද?''

''දෙව්ඳ, පිනක් තියෙනවාමයි.''

''එහෙම නම් ස්වාමීනී, ඒ පින කිරීමේ වාසනාව මට ලැබුණා නොවේද?'' කියා සුජම්පතී දිව්‍යාංගනාව සමග දිව්‍ය වේශයෙන් තෙරුන් වහන්සේ වන්දනා කොට අහසට පැන නැගී ''අහෝ...! කස්සප මහ රහතන් වහන්සේට පූජා කළ දනයමයි උතුම්. එය මනා කොට පිහිටි දනයක්මයි'' කියා උදම් ඇනුවා.

එතකොට වේළුවනයේ වැඩ සිටි බුදුරජාණන් වහන්සේ මෙය දිවැසින් දැක්කා. මේ සියලු කතාබහ දිව්‍ය ශ්‍රවණයෙන් ඇසුවා.

''මහණෙනි, මහා කස්සපයන්ගේ සිල් සුවඳට වශීකෘත වූ සක් දෙව්ඳුන්ද පිණ්ඩපාතේ දනය පූජා කිරීමට නොයෙකුත් වෙස් ගන්නවා'' කියා වදරමින් මෙම ගාථා රත්නය වදළහ.

අප්පමත්තෝ අයං ගන්ධෝ - යායං නගරචන්දනී
යෝ ච සීලවතං ගන්ධෝ - වාති දේවේසු උත්තමෝ

තුවරල සඳුන් මල්වල - විහිදෙනා සුවඳක් වෙද
යටි සුළඟෙ පමණක් යන - අල්ප වූ සුවඳක්මය
සුවඳ සිල්වතුනගෙ - පැතිර යන විට දස දෙස
උතුම් දෙව්ලොව පවා ඒ - සුවඳ පැතිරී යන්නේ

පින්වතුනේ, පින්වත් දරුවනේ, ඒ නිසා ඔබත් ඉතාම ගුණවත් කෙනෙක් වෙන්න. සිල්වත් කෙනෙක් වෙන්න. හොඳින් තිසරණයෙහි පිහිටි කෙනෙක් වෙන්න. හැකි සෑම මොහොතකම පින් දහම් රැස් කරන්න. බුද්ධානුස්මති භාවනාවෙහි යෙදෙන්න. මෛත්‍රිය පුරුදු කරන්න. දයානුකම්පාව දියුණු කරන්න. ආඩම්බර වෙන්න එපා. අනුන්ගේ දියුණුව දැක සතුටු වෙන්න. ඊර්ෂ්‍යා කරන්න එපා. නිහතමානී සිතින් වාසය කරන්න. එවිට ටිකෙන් ටික ඔබේ ජීවිතයත් සුවඳ හමන මලක් වගේ වේවි.

ධම්ම ගවේෂී

"අධික ලෝභයෙන් යුතුව යුක්තියට පිටුපාන අය වැනසෙති - සේරිවාණිජ ජාතකය"



## දෙමාපිය නැදිමයිලන්ට සැලකීමේ අනුහස් කියැවෙන

# කච්චානි ජාතකය

ප්‍රස්මරුන් බිඳ ජයගත් හෙයින් මාරජී නම් වූ, නරසිංහ වූ, ශාක්‍යකුලතිලක වූ, ශ්‍රී ගෞතම සුගත තථාගතයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි මවුපියන්ට උපස්ථාන කරන උපාසකයෙකු අරභයා මෙම ජාතක කතාව දේශනා කොට වදාළ සේක.

එක්තරා උපාසකයෙක් දෙමවුපියන්ට මැනවින් උපස්ථාන කරමින් වාසය කළේය. ඔහුගේ දෙමාපියෝ පුතණුවනි'යි පුත්‍රයා අමතා, අපට උපස්ථාන කිරීමත්, ගොවිතැන් කටයුතුවල නිරත වීමත් එකසේ කිරීම ඔබට ආයාසකරය. එහෙයින් ඔබට සුදුසු තැනකින් බිරිඳක් ගෙනැවිත් සරණ කර ගත හොත් ඇය අපට උපස්ථාන කරනු ඇත. ඔබට නිදහසේ ගොවිතැන් බත් කළ හැකිය. එය ඇසූ එම උපාසකයා, මා විනා අන් කෙනෙක් මා මෙන් සිතේ හැටියට දෙමවුපියන්ට උපස්ථාන කරතැයි ද විචාළේය. ඔහුගෙන් නිසි ප්‍රතිචාරයක් නොලත් තැන දෙමාපියෝ සුදුසු කුලයකින් බිරිඳක් සොයා ගෙනැවිත් පාවා දුන්හ. ඒ ස්ත්‍රිය මුලදී නැදිමයිලන්ට ලෙන්ගතුව කටයුතු කළාය. නමුත් කල් යෑමෙන් පසු නැන්දනිය කෙරෙහි කලකිරී උණුපැන් ඉල්ලනා විට සීතල ජලය ද සීතල ජලය

"වැඩිහිටියන්ට අකීකරු වීම විපතට හේතුවේ - ඉන්ද්‍රගුත්ත ජාතකය"

ඉල්ලනා විට උණු පැන් ද දෙන්නීය. මාලුපිනිවල ලුණු මදැයි කී කල වැඩියෙන් ලුණු දමා දෙන්නීය. ලුණු වැඩියි කී විට අඩුවෙන් දමා දෙන්නීය. නිදියන ඇඳන්හි මකුණන් බොහෝ සිටිතැයි කී විට මම ඇඳට මකුණන් දැමූවේදැයි විමසයි. ඔබලා අසා සිටිද්දීම ඇඳ මකුණන් ගැසුවේ වේදැයි අසමින් අසල නිවැසියන්ට ඇසෙන සේ කියන්නීය. මෙම ස්ත්‍රියම ඒ මේ තැන කෙළ සොටු ගසා පුරුෂයා පැමිණි විට මේ ඔබේ මෑණියන්ගේ වැඩ යැයි බොරු බස් කියන්නීය.

එක් දවසක් සැමියාට කතා කරමින් මට ඔබේ මවුපියන්ට උපස්ථාන කළ නොහැකිය. අහර පිස තබන්නට නොහැකිය. ඔබේ මෑණියන් මෙහි සිටියොත් මට මේ ගෙදර සිටිය නොහැකිය. ඇය මේ නිවසින් යවන්නැයි ඉල්ලා සිටියාය. එවිට සැමියා ඔබ තරුණ නිසා ඔබට කොහේ නමුත් ගොස් සිටිය හැකිය. ඒත් මගේ මහලු දෙමාපියන්ට තම නිවසින් පිට කොහි ගොස් ජීවත් වන්නද? ඔබ කැමැති නම් ඕනෑ තැනක යන්නැයි කීවේය. එතැන් සිට මුලින් පැමිණි දිනවල සේම යළි නැදිමයිලන්ට උපස්ථාන කරන්නට පටන් ගත්තාය.

උපාසකයා එක් දවසක් ජේතවනාරාමයට ගොස් සර්වඥයන් වහන්සේ වැඳ එකත්පස්ව සිට මෙපවත් දන්වා සිටියේය. එවිට බුදුරජාණන් වහන්සේ තොප, අඹු කී පරිදි නොගිවිස්නා පමණක් විනා පෙර දී බිරිඳගේ බස් ගෙන මෑණියන් පහ කළේ වී දැයි වදාරා, ඒ පූර්ව කථාව කෙබඳුදැයි ඉකුත්වත් දක්වා මෙසේ වදාළ සේක.

එදවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ කෙනෙකුන් රාජ්‍ය කරන සමයෙහි බෝධිසත්වයෝ ශක්‍ර දේවේන්ද්‍රව උපන්නාහ. යටකී පරිද්දෙන් මෙහිදී උපාසකයා තමාගේ බිරිඳගේ බසට මෑණියන් ගෙයින් පහකළේය. ඔහුත් එතැන් පටන් ඈත, මෑත ඇවිදිමින් බැල මෙහෙ කොට ජීවත් වූහ. එසමයෙහි ඔහුගේ බිරිඳට දරු ගැබක් හටගත්තීය. දරුවන් ලැබ දවසින් දවසට සියලුම සම්පත් ලැබ අඩුවක් නැතිව දවස් හැර, සැමියාගේ මව සම්බන්ධයෙන් මේ මැහැලිය මගේ ගෙයෙහි ඉන්නා තෙක් අපට කිසි වැඩක් සැලසුනේ නැත. මුන්දෑ ගිය දවස් පටන් දරුවන් ලැබී අභිවෘද්ධිය සැලසුනේයැයි කීවාය.

එකල්හි උපාසකයාගේ මව තමා ගෙයින් පිටත් කළ පසු ලේලියට දරුවන් ලැබුණායි අසා මෙසේ සිතුවාය. ඉඳින් මේ ලෝකයෙහි ධර්මය නොනැසී පවතී නම් බිරිඳගේ බසට මවට තලා පෙලා දරුවෝ මෙලෙස දරුවන් ලැබී සුවපත්ව වෙසෙත් ද? ධර්මය නැසුනේය. ඒ නැසුනා වූ ධර්මයට පීතෘ පිණ්ඩ දානය දෙමැයි සිතා ඒ මෑණි දවසක් තල, මුං, සහල් වළං සැඳි සාලු අරගෙන අමු සොහොනකට ගොස් ලිප්ගලට මිනී හිස්කබලක් තබා ගිනි මොලවා ගඟට ගොස් ඉස් සෝදා නා රෙදි සෝදා බැඳි ලිප ගාවට අවුත් ඉසකේ මුදා හෙලා සාල්, බත පිසින්ට පටන් ගත්තාය.

එකල පුරන ලද බෝධි සම්භාරය ඇති බෝධි සත්වයෝ ශක්‍ර දේවේන්ද්‍රව ඉපිද දිවැසින් මනුෂ්‍ය ලෝකය බලන අතර ඒ මැහැලිය කරන ක්‍රියාව දැක බමුණු වෙසක් මවාගෙන මග යන එකෙකු මෙන් ඈ සිටිනා තැනට ගොස් සොහොනේ දී බත් පිසින කෙනෙක් නැත. එම්බා කච්චානි නම් තැනැත්තියනි, ඉස සෝදා නා සුදු පිළි හැඳ මිනී ඉස් කබලකින් ලිප් බැඳ තල කිරිබත් පිසින්නේ කාටදැයි විමසීය. එවිට මැහැල්ලිය බමුණානෙනි, මේ ලෝකයේ වැඩිමහලු නෑයන්ට ආදර සත්කාර කිරීමාදී වූ සුචරිත ධර්ම නැසුනේය. එසේ හෙයින් මම ඒ නැසුනා වූ ධර්මයට පීතෘපිණ්ඩ දානය කළෙමියි කී විට ශක්‍ර බ්‍රාහ්මණයා එම්බා කච්චානිය, අසදෘශ වූ ආනුභාව හා දහසක් නුවණැස් ඇති සද්ධර්ම ස්වරූප වූ සක් දෙව් රජ තෙම ධර්මය පවත්වමින් ජීවත් වන්නේය. එසේ හෙයින් ධර්මය නොනැසුනේ යැයි කියා සිටියේය.


එබස් ඇසූ මැහැලිය බමුණානෙනි, කුමක් කියන්නේ ද? මේ ලෝකයෙහි යම් සත්වයෙක් කුසල ධර්මයෙහි නොයෙදී පාපයෙහි යෙදී වාසය කෙරෙත් ද, එබඳු වූ සත්වයෝ පුත්‍රදාර දැසි දස් ගවමහේෂාදී ධන ධාන්‍ය සම්පත්තියෙන් සමෘද්ධ වෙති. පළමුව වඳව සිටි මගේ ලේලිය අද්‍රෝහී වූ කුල ජ්‍යෙෂ්ඨ වූ මා තලා ගෙයින් පිටත දමා දරුවන් වදා අපගේ කුලයට ප්‍රධාන වූවාය. තොප කුමක් කීවත් ධර්මය නැසුනේයැයි මට සැකයක් නැත.

අනතුරුව සක් දෙවින් කච්චානිය, ඔබ යම් ධර්මයක් මනා යැයි කී නම් ඒ ධර්මය නම් අනෙකක් නොවේ. ජීවමාන වූ මම්මය. අන් කාර්‍යයක් නැතිව තොප නිසා මෙතැනට පැමිණියෙමි. යම් ස්ත්‍රියක් තොප තලා ගෙයින් නෙරපා දරුවන් ලැබ ප්‍රබල වූ ඈ දරුවන් හා එක්ව මගේ ධර්ම තේජසින් දවා අලු කෙරෙමියි කීවේය. එවිට මැහැලිය, අනේ මේ කුමක් කියන්නේ ද? මගේ මුණුබුරා හා ලේලිය සැප සේ සිටීම යහපතැයි සිතා, සක්දෙවියන් වහන්ස, මා පිණිස මෙතැනට වැඩි සේක්නම් මම ද මගේ පුතා ද ලේලි ද මුණුබුරා ද අප සැම දෙන ඔවුනොවුන් හා සතුටුව වාසය කිරීම ඔබගේ කැමැත්ත වේවායි කී කල්හි, උන් විසින් දුකට පමුණුවනු ලැබූ තෝ සත්පුරුෂ ධර්මය නොහැර යහපතක් කැමැති වූයේ යැයි සතුටුව, තොප හැම දෙනම ඔවුනොවුන් හා සමඟ සතුටුව එක්තැන්හි වාසය කරවැයි කියා සක් දෙව් රජු ශක්‍රාත්මභාවයෙන්

සැදී පැහැදී අහසේ සිට කියනුයේ බිය නොවන්න කච්චානිය, තොපගේ පුතණුවන් හා ලේලිය මාගේ ආනුභාවයෙන් පෙරමගට අවුත් තොප කැඳවාගෙන යෙති. කුසල ධර්මයේ අප්‍රමාදව වසවයි අවවාද කොට දිව්‍ය භවනයට ගියේය.

ලේලිය හා මෑණියන්ගේ පුත්‍රයා ශක්‍රානුභාවයෙන් මෑණියන්ගේ ගුණ සිහි කොට ඇය කොහි වෙසෙන්නේ දැයි ගමේ මිනිස්සුන්ගෙන් විචාරා අමුසොහොන දිශාවට ගියායැයි දැන බිරිඳ හා දරුවා සමඟ අඬාගෙන ගොස් මෑණියන් වහන්ස අපේ දෝෂය සමා කළ මැනවැයි කීවේය. ඒ මැහැලිය ප්‍රේමයෙන් මුණුබුරා වඩාගත්තේය. සමගිව ඔවුන් සැම දෙනා ගෙට ගොස් ශක්‍රයාගේ ආනුභාවයෙන් සැප සේ වාසය කළේයැයි වදාරා, චතුස්සත්‍ය ප්‍රකාශ කොට මේ ජාතකය නිමවා වදාළ සේක. චතුස්සත්‍ය ධර්ම දේශනාව අවසානයෙහි උපාසකයා සෝවාන් ඵලයෙහි පිහිටියේය. එකල මෑණියන්ට උපස්ථාන කළ පුරුෂයා නම් වර්තමානයෙහි මාතෘ උපස්ථායක වන්නේය. එකල භාර්යාව දැන් මේ ස්ත්‍රියයි. ශක්‍ර දේවේන්ද්‍රයා නම් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේය.

දෙමාපිය නැදිමයිලන් ආදීනට සැලකීම නම් වූ සදාචාර ධර්මයන්හි මැනවින් හැසිරෙමින් ජීවිතය කුසල් දහමින් පුරවා ගැනීමට මෙම උතුම් පොහෝ දිනයේ දී අදිටන් කර ගනිමු.




**කේ. මීගහකුඹුර**

"මරුවාගෙන් පහර ලද්දහුගේ රැකවරණය පිණිස එන දරුවෝත් නැත. මවුපියෝත් නැත. නෑයෝත් නැත. නෑදෑ ආදී කිසිවකුට ඔහු බේරාගත නොහැක

# සදහම් ප්‍රහේලිකා අංක - 102

ජයග්‍රාහී වාසනාවන්තයින් තිදෙනාට දයාවංශ ජයකොඩි පොත් මැදුරින් වටිනා ග්‍රන්ථයක් තිළිණ කෙරේ... දුරකථනය - 011-2695773




### උපදෙස් :

1. මෙය නිවැරදිව හා ඉතා පැහැදිලිව පුරවා තැපැල් පතක අලවා පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.
2. ලිපිනය - සදහම් ප්‍රහේලිකාව (94), 112, දයාවංශ ජයකොඩි පොත් සමාගම, පූජ්‍ය ඇස්. මහින්ද හිමි මාවත, මරදාන.
3. තැපැල් පත් එවිය යුතු අවසන් දිනය ජනවාරි මස 30 දා බව සලකන්න
4. ජයග්‍රාහකයින් තේරීමේ අවසන් තීරණය ප්‍රධාන සංස්කාරක සතුවේ.
5. ප්‍රහේලිකාවේ අපැහැදිලි තැනක් වේ නම් 071-3391013 අමතන්න.
6. ත්‍යාගය සඳහා විමසීම් සඳහා 011 2695773 (සුසිල්) අමතන්න.

### ▶ හරහට

1. බුදුන් වහන්සේ ශ්‍රී ලංකාවට පළමු වරට වැඩම කළ පොහොය.
4. උපත ලබන සතර විධිවලින් එකකි.
6. දවස මේ නමින් දෙකොටසකට බෙදූ දක්වේ.
9. පැරැන්නෝ බඩු රැගෙන යාමට මෙය භාවිත කළහ.
10. මෙය "අසාර" දෙයක් ලෙසට බුදු දහමෙහි ඉගැන්වේ.
11. එකල මෙරට විසූ එක් ගෝත්‍රයකි.
12. "බිළිඳු" අය හැඳින්වෙන තවත් වචනයකි.
13. දශ ක්ලේෂයන්ට අයත්ය.
15. මිනිසුන්ට කරදර කරන සතෙකු ලෙස සැලකේ.
17. මුහුදු දිය මෙම රසින් යුක්තය.
19. පින් පිණිස නිතරම දිය යුතුය.
20. ශරීරයට කියන තවත් නමකි.

### ▼ පහළට

2. සමහරු මෙය නිසාද ආඩම්බර වෙති.
3. 'ගස්' යන වචනයට සමාන පදයකි.
5. මිනිසාටත්, සතුන්ටත් මෙය නැතිවම බැරිය.
7. "ඇදය" යන අරුත ගන්වයි.
8. සතර ඵලවලට අයත්ය.
10. මෙය ඇතාට ආභරණයකි.
20. සෑම පුද්ගලයකු තුළම තිබිය යුතු වටිනාම ගුණාංගයකි.
14. බුදු කල විසූ අග්‍ර ශ්‍රාවිකාවන්ගෙන් කෙනෙකි.
16. මැනීම සඳහා භාවිතා කෙරේ.
18. අධික විෂ සහිත සර්පයෙකි.

### ප්‍රහේලිකා අංක 100 ජයග්‍රාහී වාසනාවන්තයින් නම්

- සුජීවා ඉලංකෝන්, 29/11, ධර්මාශෝක මාවත, අරුප්පල, හනුවර.
- ඩබ්ලිව්. එන්. විජේරත්න, 317/5 ඒ, දුනුවිලවත්ත, දුනුවිල, අකුරණ.
- ඉන්ද්‍රා රත්නායක, 92/8, මගලෙගොඩ, වේයන්ගොඩ.

# ඔබත් දළදා වරුණට ලියන්න

**දළදා** වරුණ සැම විටම ඔබේ අදහස් උදහස් වලට ගරු කරන පුවත් සඟරාවකි. වසර එකොළහකට ආසන්න කාලයක් තිස්සේ "දළදා වරුණ" සමඟින් ප්‍රවීණ ලේඛක මඬුල්ලක් බැඳී සිටින අතර ගිහි පැවිදි ඕනෑම අයෙකු අප වෙත ලබා දෙන කාලීන හරවත් සහ සමාජයට ප්‍රයෝජනවත් වේ යැයි සිතන දහම් ලිපි සඳහාද ඉඩ කඩ ලබා දීමට අප නිරතුරු සැලකිලිමත් වන්නෙමු. එහිදී දළදා වරුණ පුවත්පතේ පළවන සියලුම ලිපි, රචනා ඒ.ඒ. කර්තෘවරුන්ගේ අදහස් මිස දළදා මාලිගාවේ හෝ එහි සංස්කාරකවරුන්ගේ අදහස් නොවන බවද සිහිපත් කරනු කැමැත්තෙමි. තනි පිටුවේ පැහැදිලි අත් අකුරින් ලියන ලද හෝ යතුරු ලියනය කළ ඔබේ බෞද්ධ ලිපිය පහත ලිපිනය වෙත යොමු කළ යුතුය. සෑම ලිපියක්ම බෞද්ධ තේමාවක් ඔස්සේ පිටු 2 කට නොවැඩි වන සේ ලිවිය යුතු බවද සලකන්න.

සංස්කාරක
"දළදා වරුණ" මාධ්‍ය ඒකකය
ශ්‍රී දළදා මාලිගය, මහනුවර

- අන්තර්ජාලයෙන් පසුගිය "දළදා වරුණ" කියවන්න www.sridaladamaligawa.lk වෙබ් අඩවියට පිවිසෙන්න

# දළදා මාලිගයෙන් පණිවුඩයක්

- මෙම සටහන සිහියෙන්, සැලකිල්ලෙන් කියවන්න

1. ඔබගේ සංවර ඇඳුම ඔබේ හැදියාවේ සංකේතයයි.
2. ඔබගේ සංවර ඇඳුම මේ පින්බිම රමණීය කරයි.
3. ඔබගේ සංවරශීලී භාවය මේ පින්බිමට සෝභාවකි. එය ඔබට ගෞරවයකි.
4. දළදා සමිඳු වැඩ සිටින උතුම් පින්බිමට එනවිට ඔබ සැරසී සිටින ඇඳුම් උචිතදැයි සිහියෙන් සිතන්න.
5. ශ්‍රී දළදා මාලිගා පරිශ්‍රයට කොට කලිසම් (පිරිමි, ගැහැනු දෙපිරිසම) පලාපු සායවල්, අත් නැති/කොට හැට්ට, දණහිසෙන් ඉහළට වන සේ කොට වූ සායවල්, ඇඳ පසු පෙදෙස නිරාවරණය වන සේ වූ ඇඳුම් යනාදියෙන් සැරසී ඒමෙන් වළකින්න.
6. ඔබ දළදා මාලිගාවට පැමිණෙන විට චාම් ලා පාට ඇඳුමෙන් සැරසෙන්න.
7. තද පාට (කළු) ඇඳුම් පින් බිමට නොහොබින බව තේරුම් ගන්න.
8. ඇඳුම ඔබේ චරිතය කියාපාන කැඩපතක් බව සිතන්න.
9. දළදා මාලිගාව පින් බිමක් මිස පෙම්වතුන්ගේ පාරාදීසයක් නොවන බව සිහියට ගන්න.
10. ඔබට ඇත්තේ දෙඇසක් වුවද ඔබ වටා ඇස් දහසක් ඇති බව මෙනෙහි කරන්න.

ඔබ හැසිරිය යුත්තේ හැඟීම්වලට වහල් වී නොව බුද්ධිමත්වය. මෙම කරුණු අප ඔබ වෙත ඉදිරිපත් කළේ කරුණාවෙන් බවත්, රට භාර ගන්නට සිටිනා මතු පරපුරට ඔබගේ ආදර්ශයක් ලබාදීමට බවත් සිහිකරනු කැමැත්තෙමු.

"නිතර අනුන්ගේ දෙස් සොයන්නා වූ, අනුන් හෙළා තලා කතා කරන්නා වූ පුද්ගලයාගේ කාමාදී පාප ධර්ම වැඩෙත්. ඔහු රහත් ඵලයෙන් ඈත්ය."



# ඔබ ප්‍රියකරන පුද්ගලයා හඳුනා ගන්නේ කොහොමද?

අපේ ජීවිතයේ අප කැමැති කතාවන් කතා කරන්නට ඒ සඳහා සුදුසු පුද්ගලයන් දැන හඳුනාගත යුතුය. විශේෂයෙන් අප කැමති යහපත් වූ දේ කරන්නට එයට සුදුසු අයත් සමග සාකච්ඡා කළ යුතුය. එසේ නොවුණහොත් තමා කරන්නට යන වටිනා දේ පවා මග හැරී යනු ඇත. ඒ මන්ද යත්, ඔවුන්ගේ නිසි ප්‍රතිචාර නැතිවීම නිසා මෙන්ම, ඔවුන් ඒ සඳහා කරන නරක විවේචන හේතු කරගෙනය.

මේ පිළිබඳව ලොව්තුරා බුදුරජාණන් වහන්සේ අංගුත්තර නිකායේ පඤ්චක නිපාතයේ දුක්කථා කියන සූත්‍රයෙන් මනාව පැහැදිලි කර ඇත. මෙහිදී පුද්ගලයන් පස්දෙනෙක් අකමැති කාරණාවන් වගේම, පුද්ගලයන් පස්දෙනෙක් කැමති කාරණාවන් දක්වා ඇත. මේ පිළිබඳව යම් තරමක හෝ අවබෝධයක් ලබා තිබීමෙන් අප කතා කරන දේ සුබඵල ළඟා කරගත හැක.

පුද්ගලයන් පස්දෙනෙක් අකමැති වන කාරණා පහ පළමුවෙන්ම දැනගමු.

**1. අස්සද්ධස්ස සද්ධා කථා දුක්ඛථා**

ශ්‍රද්ධාවක් නැති පුද්ගලයාට ශ්‍රද්ධාව පිළිබඳ කතා අප්‍රසන්න වේ. අකමැති වේ. සමහර තුනුරුවන් කෙරෙහි ශ්‍රද්ධාවක් තිබෙන අය නුසුදුසු පුද්ගලයන් හා පින්දහම් ගැන කතා කිරීමට පෙළඹේ. මේ නිසා අශ්‍රද්ධවන්තයා එම යහපත් දේ ගැන නොසතුට පළකරයි. අකමැත්තෙන් කතා කරයි.

ඒ ගැන මෙසේ දැනගමු. ''තස්මා ච භික්ඛවේ අස්සද්ධස්ස සද්ධා කථා දුක්කථා'' කොහොමද අශ්‍රද්ධවන්තයාට ශ්‍රද්ධාව පිළිබඳ කතාව අකමැති කතාව බවට පත්වෙන්නේ? අභිසජ්ජති ශ්‍රද්ධාවන්තයා සමග තර්ක කරමින් ගැටෙයි. කුප්පති, කිපෙයි. ව්‍යාපජ්ජති, තරහා ගනියි. පතිත්ථියති, නැඟී සිටියි. මේ ආකාරයෙන් ක්‍රෝධයට පත්වී යහපත් දේ පිළිකුල් කරයි. පින්දහම් කරන අයටවත් කරන්නට දෙන්නේ නැත. මේ නිසා ශ්‍රද්ධාවන්ත පින්වතුන් තෙරුවන් පිළිබඳව කතා කරන විට, සාකච්ඡා කරන විට ඒ ගැන ශ්‍රද්ධාවක්, වුවමනාවක් ඇති අයත් එක්ක කතාබහ කරන්නට උත්සාහ ගත යුතුය.

**2. දුස්සීලස්ස සීලකථා දුක්ඛථා**

දුස්සීලයාට සිල් පිළිබඳ කතා අකමැති කතාවන්ය. සිල් සමාදන්වීම් ගැන, ශීලයෙහි

''යම් කෙනෙකුගේ සිත දිවා රෑ දෙකේ අහිංසාවෙහි ඇළුණේද ඒ ගෝතම ශ්‍රාවකයෝ හැමදම සුවසේ නිදා පුබුදිත්.''

ආනිශංස ගැන, එය ආරක්ෂා කළ යුතු බව කතවත් දුස්සීලභාව පලිගනියි, ගැටෙයි, කටයුතු අවුල් කරයි.

**3. අප්පස්සුතස්ස බාහුසච්චකථා දුක්ඛථා**

සාමාන්‍ය දහම් දැනුමක් ඇති පුද්ගලයා පුළුල් දහම් දැනුමක් ගැන කතා කිරීමට රුචි නොකරයි. තමාට වඩා දහම් කාරණා ගැන කතා කරනවාටත් අකමැතිය. මේ පුද්ගලයා පෙර සේම කිපෙයි. නොයෙක් ආකාරයෙන් ගැටුම් ඇතිකරයි.

**4. මච්ඡරියස්ස චාග කථා දුක්ඛථා**

මසුරු තැනැත්තා ත්‍යාගවන්තකම ගැන කතා කරනවාට කැමැති නැත. මසුරා යනු තමන්ට කොතරම් ධනය, වස්තුව තිබුණත් ඒවා පරිහරණය නොකරන්නෙකි. සැප සම්පත් තමන් භුක්ති විඳින්නේ නැහැ. අනුන්ට දෙන්නෙත් නැත. මෙවැනි පුද්ගලයෙක් සමග දන්දීමේ පරිත්‍යාග ගැන කතා කිරීම නිෂ්ඵල දෙයක් වනු ඇත. තමන් කරන ක්‍රියාවන්ද හැල්ලුවට ලක් කරනු ඇත.

**5. දුප්පඤ්ඤස්ස පඤ්ඤා කථා දුක්ඛථා**

පින, පව, කර්මය, පුනර්භවය වැනි මනුෂ්‍යයෙක් විසින් දැනගත යුතු උතුම් දැනුමක් බුද්ධිමත් නොමැති පුද්ගලයා එවැනි හරවත් දැනුමක් පිළිබඳ කතා අප්‍රිය කතා ලෙස සලකනු ඇත.

කෙනෙකු ප්‍රඥාවන්ත වන්නේ සංසාරේ ආත්මෙන් ආත්මෙට තම මනස යහපත් ආකාරයෙන් පවත්වා ගැනීම නිසාය. එවැනි කෙනෙකුට ලෝකයේ සැබෑ තත්ත්වය හඳුනා ගැනීමට හැකිවේ.

එවැනි දැනුමක් නොමැති පුද්ගලයා ලෝක ස්වභාවය ගැන කරුණු පුළුල් ලෙස කතා කරනවාට විරුද්ධය.

ඉහතින් දැක්වූ යහපත් කාරණාවන්ට අකමැති පුද්ගලයන් වගේම කැමති පුද්ගලයන් ඇත. ඒ අනුව තමා ප්‍රිය කරන ඒ දහම් කාරණාවන්ට කැමැති පුද්ගලයන් හඳුනාගෙන සාකච්ඡා කළ හැකිය.

**1. සද්ධස්ස සද්ධා කථා සුතථා**

ශ්‍රද්ධාවන්තයන්ට සැදැහැවත් කතා ප්‍රියකරන කතාවන්ය. තෙරුවන් පිළිබඳව නිරන්තර ඇසීමට කැමැතිය. පින්දහම් කරන පින්වතුන් ගැන මෙන්ම, බණ භාවනාවන්ට යොමුවුණු සිල්වතුන් ගැන අසන්නට බොහෝ කැමැතිය.

**2. සීලවතෝ සීලකතා සුකථා**

සිල්වතාට සීලය ගැන කරන කතාව ඉතා වටියි. බුද්ධ ශාසනය තුළ ඇති සියලු සිල්පද ගැන විමසයි. රහතන් වහන්සේගේ චරිත කතා අසන්නට කැමැතිය. සිල්වතුන්ගේ ජීවිත කතා ශ්‍රවණයට කැමැතිය.

**3. බහුස්සුතස්ස බාහුසච්ච කථා සුකථා**

බොහෝ දහම් දැනුමක් ඇති පින්වතා එවැනි තවත් දහම් කාරණා ගැන ඇසීමට, සාකච්ඡා කිරීමට ප්‍රිය වේ.

**4. චාගවතෝ චාගකථා සුකථා**

ත්‍යාගවන්ත පුද්ගලයා දන්දීම් ආදී පරිත්‍යාග ක්‍රියාවන් ගැන ඇසීමට කැමැතිය. කෙනෙකු යම් පරිත්‍යාගයක් කරනවා යැයි ඇසුවොත් ඉන් හෙතෙම සතුටක් ලබයි. තව තවත් දන් දෙන පුද්ගලයන් ගැන දැනගැනීමට කැමැති වෙයි.

**5. පඤ්ඤවතෝ පඤ්ඤකථා සුකථා**


ප්‍රඥාවන්තයා කර්මය, කර්ම ඵලය, පුනර්භවය, හේතුඵලවාදය වැනි සදාතනික දහම් කාරණාවන් ශ්‍රවණය කරන්නට කැමැතිය. එවැනි කාරණාවන් සාකච්ඡා කිරීමට කැමැතිය.



ඉහතින් දැක්වූ යහපත් කාරණාවන්ට කැමැති පස්දෙනා ඒ දහම් කාරණාවන් ගැන සතුටක් ඇතිකර ගනී. තව තවත් යහපත් දේ සොයා යයි. එහෙත් මුලින්ම දැක්වූ පස්දෙනා දහම් කාරණාවන් ගැන කතා කරන විට කෝප වෙයි. බැණ වදියි.

එසේ නම් හැම කෙනෙක්ම කතා කරන්නට පෙර තමා කතා කරන්නේ කා සමගද කියා විමසිය යුතුය. යහපත් දේ ගැන වුවත් අප කතා කළ යුත්තේ ඊට සුදුසු කෙනා අනුවය. නැතිනම් තමා කරන්නට යන වටිනා දේ වුවත් කිරීමට නොහැකි වනු ඇත. සිත කළකිරීමට ලක්වනු ඇත. තමාගේ වටිනා අවස්ථාව මගහැරී යනු ඇත. ඒ නිසා පුද්ගලයන් දැන හඳුනාගෙන කතා කරන්නට ඔබත් සිතට ගත යුතුය.

පූජ්‍ය ගෝණදෙණියේ සීවලී හිමි



# අසිරිමත් මහ බෝ වන්දනාව

## ජනවාරි 21 වැනිදා

**මහනුවර** සිරි සිදුහත් භික්ෂු පදනම සහ සිරිමහ බෝ පදනම මෙහෙයවන අසිරිමත් මහ බෝ වන්දනාව සහ මහ බෝ පෙරහර 12 වැනි වතාවටත් ජනවාරි මස 21 වෙනි දින සවස 1.00 සිට සවස 6.00 දක්වා අනුරාධපුර ජයශ්‍රී මහ බෝධීන් වහන්සේ අභියසදී පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත.

මෙම වන්දනාවට සහභාගි වන බැතිමතුන් ජනවාරි මස 21 වැනි දින උදේ 6.30 ට ඒකාබද්ධ රථ පෙරහරකින් කටුගස්තොටින් පිටත්ව පෙරවරු 9.00 ට දඹුල්ල විහාරය අබියසට ළඟාවී, මාතලේ දඹුල්ල ප්‍රදේශයෙන් සම්බන්ධවන වන්දනාකරුවන් සමග පිටත්ව උදේ 11.00 ට පමණ රුවන්වැලි මහ සෑ සමිඳුන් අබියසට පැමිණ සවස 1.00 ට මහ බෝ පෙරහර සකස්ව සවස 2.00 ට මහ බෝ පෙරහර පංචතූර්ය නාදයෙන් මහා සංඝරත්නය පෙරටු කරගෙන ජයශ්‍රී බෝ සමිඳුන් අබියස කරා ගමන් කරනු ඇත. රටේ අනාගත සශ්‍රීකත්වය සංකේතවත් කරමින් මධ්‍යම, වයඹ, රජරට පළාත්වලින් නෙළා ගත් අස්වනු, භෝග, සම්පත්, ඖෂධ වර්ග තැන්පත් කරන ලද මහා පාත්‍රයක් පෙරහරෙන් ගෙන ගොස් ජයශ්‍රී මහ බෝ සමිඳුන්ට පූජා කිරීමද විශේෂතාවකි. සවස 4.30ට මහ බෝ වන්දනාව ආරම්භ කෙරේ.



## අමුණුපුර පියරතන හිමියන්ගේ කෘති මල්වතු නාහිමියන් අතට

**මහනුවර** අස්ගිරිය මහා විහාර පාර්ශ්වයේ සංඝ සභාවේ මහෝපාධ්‍ය, ශාස්ත්‍රවේදී, පණ්ඩිත අමුණුපුර පියරතන හිමි විසින් ලියන ලද "ප්‍රාතිමෝක්ෂ සංවර ශීලය හා නිර්වාණගාමී ප්‍රතිපදව", "ප්‍රථම උදනය", "මහින්දගමනයේ අසිරිය", "අස්ගිරි විජයසුන්දරාරාමයේ අසූ මහ ශ්‍රාවක පූජාව", "ධර්ම දේශනා" සහ "ගිරිමානන්ද සූත්‍රය" යන ධර්ම ග්‍රන්ථ පිටපත් සමූහයක් මල්වතු පාර්ශ්වයේ අති ගෞරවාර්ය තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගල මාහිමිපාණන් වහන්සේ වෙත පිළිගැන්වූ අවස්ථාව.





## හසලක සීලරතන හිමිපාණෝ 50 වැනි ජන්ම දිනය සමරති



**ඓතිහාසික** වළල රජමහා විහාරය, මහියංගණ දෙහිගොල්ල ශ්‍රී පූර්වාරාමය හා ගම්පහ හප්පිටිය ශ්‍රී පූර්වාරාමය යන විහාරයන්හි විහාරාධිපති, වළල රජමහා විහාරයේ භාරකාරධුරන්ධර ගරු හසලක සීලරතන හිමිපාණන් වහන්සේ 2017 ජනවාරි මස 9 වැනි දිනට තම දිවි ගමනේ අඩසිය වසට පා තබනු ලැබූහ.


ඒ නිමිත්තෙන් උන්වහන්සේගේ ආදරණීය දෙමව්පියන්ගේ සතුට පිණිසද, ගුරු දේවයන් වහන්සේ වන වළල රජමහා විහාරය, මහියංගණය දෙහිගොල්ල ශ්‍රී පූර්වාරාමය හා පිටියේගෙදර පුරාණ රජමහා විහාරය යන විහාරයන්හි විහාරාධිපතිව වැඩ සිට අපවත්වී වදළ, ශ්‍යාමෝපාලි වංශික මහා නිකායේ, අස්ගිරි මහා විහාර පාර්ශ්වයේ පාතදුම්බර උප ප්‍රධාන සංඝනායක ධුරන්ධර වළල ශ්‍රී සාරානන්ධාභිධාන මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ, හසලක මහගලහින්න ශ්‍රී පියදස්සනාරාමාධිපතිව වැඩ විසූ උඩුදුම්බර මිනිපේ ද්විතීය සංඝනායක ධුරන්ධර උඩවෙල ශ්‍රී පියදස්සාභිධාන නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ සහ වතුරුගම හප්පිටිය ශ්‍රී පූර්වාරාමාධිපති ගරු උඩිස්පත්තුවේ ශ්‍රී උපනන්දභිධාන මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ ඇතුළු ගුරු දේවයන් වහන්සේලා හා පින්වත් දයක කාරකාදීන්ට පරලොවට පින් පිණිස විශේෂ පින්කම් මාලාවක්ද සිදුකරනු ලැබීය.

**කේ. බණ්ඩාරනායක**




"ද්වේශ රහිත වූ යමෙක් බැණීම් ගැහීම් හා වධ බන්ධනත් ඉවසාද, ඉවසීම බලය කොටත් බල ඇණිය කොටත් ගත් ඔහු උත්තමයෙකි."

# විදු මතය අභිබවන බුදු මතය



සියල්ල දත් ඥානය පහළ වන්නේ බුදු කෙනකුටය. පුළුල්ව සලකා බලන විට සම්මා සම්බුදුරජාණන් වහන්සේලාටය. බුද්ධ යන වචනයේ අර්ථය අවබෝධයයි. ලොව පවත්නා සත්‍යාවබෝධය තුළින් බුද්ධත්වය ලබාගත හැකිය. ලොවට තුන් ආකාරයක බුදුවරයන් වහන්සේලා පහළ වෙති. ඒ සම්මා සම්බුද්ධ, පච්චේක බුද්ධ හා මහ රහත් වශයෙනි. එයිනිදු සම්මා සම්බුද්ධත්වයට පත්වූ උතුමන්ගේ අවබෝධ ඥානය අන් කිසිවකුට සමාන නොවේ. එය දෙව් මිනිසුන් අතර සුවිශේෂී ඥානයකි.

අප ගෞතම තථාගතයන් වහන්සේට එම ඥානය ලබාගැනීමට කල්ප ලක්ෂ ගණන් පෙරුම් පුරමින් අනන්ත වූ මහන්සියක් දැරීමට සිදුවිය. රහත් භාවය ලබා සසරින් මිදීමට තිබූ අවස්ථාව මගහැර සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් තවදුරටත් පාරමී පුරමින්, සසර අනන්ත දුක් විඳිමින්, දඹදිව ගයා නදී තීරයේදී, ජයශ්‍රී මහා බෝධි මූලයේදී ශ්‍රී සම්බුද්ධත්වය ලබාගත් පසුව තමන්ගේ ඥානය මෙනෙහි කරමින් සති හතක් මුළුල්ලේ විවේක සුවයෙන් ගත කළේ තමන් වහන්සේ එතෙක් සසරේ විඳි අපමණ වෙහෙසෙන් විවේක ගනිමිනි. මෙසේ අනේක දුක් විඳිමින් ගෙවන සසරට හේතුව සොයාගත් බුදුන් වහන්සේ එම හේතු ඵල ධර්මයන් ලෝකයාට දේශනා කළ සේක.

බුදුන් වහන්සේ අවබෝධ කරගත් ධර්මය තුළින් මුලින්ම දේශනා කළේ දම්සක් පැවැතුම් සූත්‍රයයි. එය දේශනා කොට අවසානයේ ධර්මාවබෝධය ලබා සෝවාන් ඵලයට පත්වූ අඤ්ඤා කොණ්ඩඤ්ඤ තවුසාණන් බුදුන් වහන්සේ දේශනා කළ පරිදිම ''විජ්ජා උදපාදී'' යනුවෙන් ප්‍රකාශ කළේ විද්‍යාව පහළ වූ බවට සිංහ නාද කරමිනි. එයින් කියැවුණේ ඥානය ලොවට පහළ වූ බවය. එසේනම් විද්‍යාව යනු ලෝකයේ පවතින ඇත්ත තත්ත්වය පිළිබඳ දැනුමය.

"කෝපයෙන් මත් වූ තැනැත්තා උමතු අශ්වයෙකු පිට නැගී යන්නෙකු වැනිය"


ජීවත් වීමේදී මිනිසාට අනේකවිධ ගැටලු ඇතිවේ. ඒවා භෞතික ගැටලු විය හැකිය. නැතහොත් සමාජයීය, මානසික, රසායනික, තාරුකා ආදී විවිධ වූ අංශගතව ඇතිවන ගැටලුය. ඒවා විමර්ශනය කොට විසඳුම් සොයා පෙන්වා දීම විද්‍යාවේ කාර්යයකි. එහෙත් වර්තමාන ලෝකයේ මිනිසා භාවිත කරන විද්‍යාවන්ගේ අවසාන නිගමනය තවමත් සොයාගෙන නැත. සියලු විද්‍යාවන් පර්යේෂණ මට්ටමේ පවතී. අද පිළිගන්නා ඇතැම් කරුණක් හෙට අභියෝගයට ලක්විය හැකිය. එය නූතන විද්‍යාවන්ගේ ලක්ෂණයකි. අලුත් සොයා ගැනීමක් නිසා මෙතෙක් සොයාගෙන ඇති නිගමනයන් වෙනස් වෙයි.

රාජ්‍ය පාලනයේදී යොදා ගන්නා දේශපාලන විද්‍යා මත කලින් කල වෙනස් වෙයි. ඒ අනුව ලෝකයේ රටවල පාලකයන් වරින් වර පරිවර්තනයන්ට භාජනය විය. රට රටවල සම්පත් උපයෝගි කරගැනීමට අදාළ ආර්ථික විද්‍යාවේ මත කලින් කල වෙනස් වෙමින්, විකාශනය වෙමින් පවතී. භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ජීව විද්‍යාව, වෛද්‍ය විද්‍යාව, ජ්‍යාතිෂ විද්‍යාව ආදී මේ කුමන විද්‍යාව ගත්තද තත්ත්වය එසේය.

එසේ වුවද තථාගතයන් වහන්සේගේ බුද්ධ ඥානය තුළින් කළ දේශනා මේ සියල්ල ඉක්මවමින් සදාකාලිකවම නොවෙනස්ව පවතී. බුදුන් වහන්සේ දේශනා කළ ව්‍යග්ගපජ්ජ සූත්‍රය, සිඟාලෝවාද සූත්‍රය ආදී සූත්‍ර ධර්මවලින් දේශනා කළ හිගකම හා සම්පත් පරිභෝජනය පිළිබඳ කරුණු අදටත් සත්‍යය. එහෙත් එයින් පසුව වෙනත් ආකාරවලට ආර්ථික විද්‍යාඥයන් ඉදිරිපත් කළ මත පළකිරීම් හෝ නිර්වචන බිඳ වැටී ඇත. දේශපාලන විද්‍යාව සම්බන්ධයෙන් ගත් කල බුදුන් වහන්සේ දේශනා කළ දස රාජ ධර්මය, දස සක්විති වත්, රාජ්‍ය පාලනයේදී අදටද යොදා ගන්නේ නම් සාධාරණ හා ගැටුම්වලින් තොර සෞභාග්‍යමත් රාජ්‍ය පාලනයක් කරගෙන යා හැකිය. එසේම පරාභව සූත්‍රය, මංගල සූත්‍රය, වසල සූත්‍රය ආදී සූත්‍ර ධර්මයන් තුළින් සමාජයට දේශනා කළ නූතන සමාජ විද්‍යාර්ථීන්ගේ මත දක්වීම් අභිබවා ගොස් ඇත. එම කරුණු සමාජ දියුණුවට සර්වකාලීනව වැදගත් වේ.

විශ්වය පිළිබඳ ගවේෂණය කරන තාරකා විද්‍යාඥයන් තවමත් නිරීක්ෂණ කටයුතුවල නිරත වෙමින් සිටියද තථාගතයන් වහන්සේ මෙයට වර්ෂ දෙදහස් පන්සියයකට ඈතදී චක්කමාල සූත්‍රයෙන් පෘථිවි තල මන්දකිණි හා තාරකා සම්බන්ධ කරුණු සිය නුවණින් බලා දේශනා කර ඇත. විශ්වයේ පරිණාමය ගැන නූතන විද්‍යාඥයන් විවිධ මත පළ කරමින් ගවේෂණවල නිරත වුවද බුදුන් වහන්සේ අග්ගඤ්ඤ සූත්‍රයේ ඒ පිළිබඳව දේශනා කර ඇත.

වර්තමානයේ වෛද්‍ය විද්‍යාව අනුව මිනිස් සිරුර පිළිබඳවත්, මිනිසාට ඇතිවන රෝග පිළිබඳවත් සොයා බැලීමට සිරුරු කපා පරීක්ෂා කර නිගමනවලට



එළඹෙති. එහෙත් බුදුන් වහන්සේ ගිරිමානන්ද සූත්‍රයෙන් මිනිසාට ඇතිවන ලෙඩ ගැන දේශනා කර ඇත. ජීවීන් පිළිබඳ සොයා බලා නිගමනවලට එළඹීම ජීව විද්‍යාව මගින් කරනු ලබයි. එහෙත් බුදුන් වහන්සේ මේ පිළිබඳ නියාම ධර්ම පහක් ගැන දේශනා කරමින් හේතුන් පහක් දක්වා ඇත.

මේ අනුව පැහැදිලි වන වැදගත් කරුණ වන්නේ නවීන විද්‍යාවට සොයාගත නොහැකි කරුණු පවා බුද්ධ ඥානයෙන් සොයා බලා ලෝකයාට දේශනා කර ඇති බවය. එබැවින් නූතන විද්‍යාව අභිබවා බුද්ධ දේශනාව ඉදිරියෙන් ඇති බව ඉඳුරාම කිව හැකිය.

**බණ්ඩාර ඇකිරියගල**